74 වන කාණ්ඩය
2 වන කලාපය

අගහරුවාද
1967 අගෝස්තු 22

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 477]

ශෝක ප්‍රකාශය : ආචාර්ය ඩබ්ලිව්. ඊ. ස්වේස් [තී. 492]

පළමුවන වර කියවන ලද පනත් කෙටුම්පත් [තී. 493] :

පොල් කෙඳි පනත් කෙටුම්පත

විසර්ජන කෙටුම්පත් පනත, 1967-68 [දහවන වෙන් කළ දිනය] [තී. 494] :

ශීර්ෂ 14-18 ; 22-25 සහ 26 කාරක සභාව විසින් සලකා බලන ලදී.

දුම්කොළ බදු පනත : ආඥාව [තී. 686]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 74
இல. 2

செவ்வாய்க்கிழமை
22 ஒகஸ்ட் 1967

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 477]
அனுதாபத் தீர்மானம் : டொக்டர் டபிள்யூ. ரீ. ஸ்ரேஸ் [ப. 492]
தென்னந்தும்பு மசோதா [ப. 493] :
முதன்முறை மதிப்பிடப்பட்டது
ஒதுக்கீட்டு மசோதா, 1967–68 [ஒதுக்கப்பட்ட பத்தாம் நாள்] [ப. 494] :
குழுவில் ஆராயப்பட்ட தலைப்புக்கள் 14–18 ; 22–25 ; 26
புகையிலைவரிச் சட்டம் : கட்டளை [ப. 686]

Volume 74
No. 2

Tuesday
22nd August 1967

PARLIAMENTARY DEBATES

(HANSARD)

HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [col. 477]
VOTE OF CONDOLENCE : DR. W. T. STACE [col. 492]
COCONUT FIBRE BILL [col. 493] :
Read the First time
APPROPRIATION BILL, 1967-68 [Tenth Allotted Day] [col. 494] :
Considered in Committee Heads 14-18 ; 22-25, and 26
TOBACCO TAX : INCREASE OF [col. 686]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1967 අගෝස්තු 22 වන අඟහරුවාදා

செவ்வாய்க்கிழமை, 22 ஓகஸ்ட் 1967

Tuesday, 22nd August 1967

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා, [එස්. සී. ෂර්ලි කොරයා මයා.] මූලාසනාරූඪ විය.

சபை மு. ப. 10 மணிக்குக் கூடியது. உப சபாநாயகர் அவர்கள் [திரு. எஸ். சீ. ஷேர்லி கொறயா] தலைமை தாங்கினார்கள்.

The House met at 10 A.M., MR. DEPUTY SPEAKER [MR. S. C. SHIRLEY COREA] *in the Chair.*

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

ජාතික ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂවරු

தேசிய லொத்தர் சபை : அதிபர்கள்

NATIONAL LOTTERIES BOARD: DIRECTORS

1. **ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)

(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ)

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ජාතික ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ලිපිනයන් කුමක්ද? (ආ) ඔවුන්ට දෙන ලද අවුරුදු පතා ගෙවීම් මොනවාද? කීය බැගින්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) தேசிய லொத்தர் சபை அதிபர்களினது பெயர்களும், முகவரிகளும் யாவை? (ஆ) அவர்களுக்குக் கொடுக்கப்படும் வருடாந்த ஊதியங்கள் யாவை? ஒவ்வொருவருக்கும் கொடுக்கப்பட்ட தொகை என்ன?

asked the Minister of Finance: (*a*) What are the names and addresses of the directors of the National Lotteries Board? (*b*) What are the annual payments made to them? What is the amount paid to each one of them?

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)

(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)

(The Hon. U. B. Wanninayake—Minister of Finance)

(අ) සිංහ වීරසේකර මහතා, සභාපති, 15/2, ගිල්ෆර්ඩ් ක්‍රෙසන්ට්, කොළඹ 7; ජී. සී. එච්. කොතලාවල මහතා, 3/5, 8 වැනි පටුමග, පාගොඩ පාර, නුගේගොඩ; සී. බී. ඇම්. බෝගොල්ලාගම මහතා, ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ සහ නොතාරිස්, 10, පුත්තලම් පාර, කුරුණෑගල; ඒ. අයි. මාකන් මාකර් මහතා, 147, ධම්මපාල මාවත, කොළඹ 7; ජේ. පුංචිහේවා මහතා, 280/2, වේල්ස් කුමාර මාවත, කොළඹ. (ආ) සභාපති තැන්පත් සිංහ වීරසේකර මහතාට වර්ෂයකට රු. 3,600 ක සියල්ල ඇතුළත් දීමනාවක් ගෙවනු ලැබේ. ක්‍රියාකාරී අධ්‍යක්ෂ වන ජී. සී. එච්. කොතලාවල මහතාට මසකට රු. 1,000 ක සියල්ල ඇතුළත් දීමනාවක් ගෙවනු ලැබේ. මණ්ඩලයේ රැස්වීමකට සහභාගිවීම වෙනුවෙන් එක් සාමාජිකයකුට රු. 50 ක දීමනාවක්ද, ලොතරැයි ඇදීමකට සහභාගිවීම වෙනුවෙන් එක් සාමාජිකයකුට රු. 25 ක දීමනාවක්ද, සී. බී. ඇම්. බෝගොල්ලාගම, ඒ. අයි. මාකන් මාකර් සහ ජේ. පුංචිහේවා යන මහතුන්ට ගෙවනු ලැබේ. ඒ අනුව 1965 ඔක්තෝබර් මාසයේ සිට 1966 සැප්තැම්බර් මාසය දක්වා මේ මහතුන් තිදෙනාට පිළිවෙළින් රු. 2,100 ක්, රු. 1,150 ක් සහ රු. 2,275 ක් ගෙවා තිබේ.

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

ලොතරැයි මණ්ඩලයේ මීට කලින් සිටි සාමාජිකයනට මීට වඩා අඩු දීමනා ගෙවූ බව ගරු ඇමතිතුමා දන්නවාද? මේ අන් දමට ඒ අයට ගෙවන දීමනා මුදල් වැඩි කළේ මක් නිසාද?

ගරු වන්නිනායක

(கௌரவ வன்னிநாயக்க)

(The Hon. Wanninayake)

ඒ දවස්වල මීට වඩා අඩුවෙන් වැඩ තිබුණේ. දැන් වැඩියෙන් වැඩ කරනවා. ලොතරැයි මණ්ඩලයෙන් දැන් පෙරට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වන්නිනායක]

වඩා විශාල ආදායමක් ලැබෙන බව කවුරුත් පිළිගන්නවා. ඉස්සරට වඩා හොඳට දැන් වැඩ කරනවා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ආදායම වැඩි වී තිබෙන්නේ ලොතරැයි ටිකට් වැඩියෙන් විකිණෙන නිසයි. එම නිසා ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ට තිබුණාට වඩා වැඩි වැඩක් පැවරී ඇත කියා අපට සිතන්නට බැහැ. ඇත්ත වශයෙන්ම මේ දීමනා ගෙවීම ගැන අප විරුද්ධ වන්නේ නැහැ. ඒකට වරදක් නැහැ. නමුත් මගේ අතුරු ප්‍රශ්නයට ඒ පිළිතුර දුන්නෙ සිතට එකඟවද කියා මා දැනගන්නට සතුටුයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

අප ආණ්ඩුව භාර ගන්නා විට ලොතරැයි මණ්ඩලයේ නොයෙකුත් අයහපත් දේවල් තිබුණා. අප ඒවා බොහොමයක් නැති කළා. පෙරට වඩා සාර්ථක අන්දමින් දැන් ලොතරැයි මණ්ඩලයේ කටයුතු කරගෙන යන බව කියන්නට පුළුවනි.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

කලින් අයහපත් දේවල් තිබුණා නම් ඒවා ගැන සොයා බලන්නට කොමිෂන් සභාවක් පත් කරනවාද? තමුන්නාන්සේලාගේ පණ නල රැකෙන්නෙ ඔය මණ්ඩලය නිසයි. ඒක දන්නවාද?

ස. තො. ස. සේවකයනට දේශපාලන අයිතිවාසිකම්

கூ. மொ. வி. ஊழியர் : அரசியலுரிமைகள்

C. W. E. EMPLOYEES : POLITICAL RIGHTS

2. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
(திரு. பி. வை. துடாவ—மாத்தறை)
(Mr. B. Y. Tudawe—Matara)

රාජ්‍ය කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජයේ සේවකයනට ලැබෙන වරප්‍රසාද ස. තො. ස. සේවකයනට නො ලැබෙන බවත්, එසේ තිබියදී ඔවුන්ගේ දේශපාලන අයිතිවාසිකම් නැති කිරීම අසාධාරණ බවත්, එතුමා දන්නවාද? (ආ) මෙම සේවකයනට රජයේ සේවකයනට ලැබෙන සියලු වරප්‍රසාද ලැබෙන තෙක් පළාත් පාලන මණ්ඩලයන්හි මහජන නියෝජිතයන් මෙන් තේරී පත්වීමේ හා ක්‍රියා කිරීමේ නිදහස ලබා දෙනවාද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா: (அ) அரசாங்க ஊழியருக்குக்கிடைக்கும் சலுகை கூ. மொ. வி. ஊழியருக்குக் கிடைப்பதில்லையென்பதையும், அதனால் அவர்களின் அரசியலுரிமைகளை இல்லாமற் செய்தது நீதியற்றதென்பதையும் அவர் அறிவாரா? (ஆ) இவ்வூழியருக்கு, அரசாங்க ஊழியருக்குக் கிடைக்கும் சலுகைகள் அனைத்தும் கிடைக்கும் வரை உள்ளூராட்சிச் சபைகளில் மக்களின் பிரதிநிதிகளாக தெரிவு செய்யப்படவும், செயலாற்றவும் உரிமை பெற்றுக்கொடுப்பாரா? (இ) இன்றேல், ஏன்?

asked the Minister of State: (*a*) Is he aware that privileges enjoyed by public servants are not enjoyed by C. W. E. employees and that it would be unjust in those circumstances to deprive them of their political rights? (*b*) Will he give these employees the right to be elected to membership of local authorities, and to function as such members till such time as all privileges enjoyed by public servants are extended to them? (*c*) If not, why?

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

(අ) නැත. (ආ) නැත. (ඉ) පැන නොනගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

තමුන්නාන්සේලා දුන් මැතිවරණ පොරොන්දු අනුව රජයේ සේවකයන්ට පවා දේශපාලන අයිතිවාසිකම් දිය යුතුයි. එසේ නම් ස. තො. ස. සේවකයන්ගේ දේශපාලන අයිතිවාසිකම් නැති කරන්නේ මක්නිසාද ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ස. තො. සේ සේවකයන්ගේ දේශපාලන අයිතිවාසිකම් නැති කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව ගත් තීරණයක් අනුවයි. ඒ තීරණය අප දැන් පිළිපදිනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ඒක හරි වැඩක් නොවැ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)

දේශපාලන අයිතිවාසිකම් දෙනවාය කියා තමුන්නාන්සේලා දුන් පොරොන්දුව කඩ කරන්නට පුළුවන්ද ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

මා කියවන්නට යනව, ඒ සම්බන්ධව 1967 මැයි 21 වන දින——

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

කියවන්නට බැහැ. කරුණා කර ප්‍රශ්නයක් අසනවා නම් අසන්න.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

පහත සඳහන් චක්‍ර ලේඛනය යැවූ බව ගරු ඇමතිතුමා දන්නවාද ? ඒ චක්‍ර ලේඛනයේ විස්තර මෙහෙමයි——

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

I cannot allow that document to be read. The hon. Member can ask a question on the material he has got.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මං අහන්නෙ මේ ප්‍රශ්නයයි. 1967 මැයි 21 වැනිදා අංක 21 ඒ. බී. 67 දරණ චක්‍ර ලේඛයෙන් සතොසේ සාමාන්‍යාධිකාරිතුමා පහත සඳහන් අන්දමට නියෝග වගයක් නිකුත් කර තිබෙනවා.

"රජයේ සේවකයන්ගේ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුව තීරණයක් ගන්නා තුරු........."

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

That matter does not arise out of this Question. If the hon. Member wishes he can give notice of a separate Question.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

මේ චක්‍ර ලේඛය අනුව 1967 මැයි 21 වැනිදා සතොසේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් තහනම් කෙළේ තමුන්නාන්සේලා නේද කියා මා අහන්නට කැමතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

That is a question based on the document that is in the hon. Members possession. He can give notice of the Question.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මා ඒ චක්‍ර ලේඛය බලන්නට සතුටුයි.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

දන්මම මා එය තමුන්නාන්සෙට දෙන්න ලෑස්තියි. මේක ඇත්ත නම් තමුන්නාන්සේ කිව්වේ පල් බොරුවක් බව තමුන්නාන්සේ පිළිගන්නවද?

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The hon. Member should withdraw the words *pal boruwa*. Some Members use such words at times. I would ask them to remember that this is the House of Representatives, and they should not use such language in the House.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

මේක ඇත්ත නම් තමුන්නාන්සේ කිව්වේ අසත්‍යයක් බව තමුන්නාන්සේ පිළිගන්නවද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මා කීවේ සත්‍යයක් බව ඔප්පු කළොත් තමුන්නාන්සේ මොනවද කරන්නෙ? [බාධා කිරීමක්] මා කීවේ ඇත්ත බව මම ඔප්පු කරන්නම්.

බරවාරෝග මර්දන ව්‍යාපාරය, මාතර

மாத்தறையில் யானைக்கால் நோய்த் தடுப்பியக்கம்

ANTI-FILARIASIS CAMPAIGN IN MATARA

3. **තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මාතර නගරය තුළ බරවාරෝගයෙන් පෙළෙන්නවුන්ගේ සංඛ්‍යාව එතුමා සඳහන් කරනවාද? (ආ) මෙම රෝගය ව්‍යාප්තවීම වැළැක්වීම පිණිස දනට ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ එතුමා මෙම සභාවට ඉදිරිපත් කරනවාද? (ඉ) නගරය අවට ප්‍රදේශවලට මෙම රෝගය පැතිර යාමේ තර්ජනයක් ඇති හෙයින් එම ප්‍රදේශවල මහජනයාගේ ලේ පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීම අවශ්‍ය බව එතුමා දන්නවාද? (ඊ) එසේ නම්, එබඳු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකරන්නේ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) மாத்தறை நகரில் யானைக்கால் நோயினால் பீடிக்கப்பட்டவர்களின் எண்ணிக்கையை அவர் குறிப்பிடுவாரா? (ஆ) இந்நோய் பரவுவதைத் தடுப்பதற்கு இப்போது நடைமுறையிலுள்ள ஒழுங்குத் திட்டத்தை அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா? (இ) நகரைச் சூழவுள்ள பகுதிகளுக்கு இந்நோய் பரவக் கூடிய அச்சமூட்டும் நிலை நிலவுவதனால் அப் பகுதியிலுள்ள மக்களின் இரத்தத்தைப் பரிசோதிக்கும் திட்டத்தை விரிவான முறையிற் செயற்படுத்துவதவசிய மென்பதை அவர் அறிவாரா? (ஈ) அவ்வாறாயின் அவ்வகையான திட்டத்தை செயற்படுத்தாததேன்?

asked the Minister of Health: (*a*) Will he state the number of filaria patients in the Matara town? (*b*) Will he table the programme of work which is being implemented to prevent this disease from spreading? (*c*) Is he aware that since there is a threat of the disease spreading to the suburbs of the Matara town, it is necessary to expand the scheme of conducting blood tests of the people in these areas? (*d*) If so, why is such a scheme not being carried out?

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)
(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

(*a*) 1,898 microfilaria positive cases and 1,806 clinical cases. Total 3,704. (*b*) Yes. The programme of work comprises: (*a*) Vector control, (*b*) Parasite control and (*c*) Health Education. *Vector Control*: In Vector

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

control the following activities are carried out: (1) Spraying of all breeding places with insecticide in diesel oil at weekly intervals. (2) The elimination of all temporary breeding places. These activities are undertaken by a gang of 22 labourers under the supervision of 1 P. H. I. and 4 overseers. (3) Fogging of 889 houses in Polhena with insecticide to destroy adult mosquitoes. This is undertaken by a driver-overseer and 2 labourers. (4) Entomological investigations for evaluation of Anti-Larval and imagicidal programmes. This is done by a P. H. I. (Entomology) and 2 field attendants. *Parasite Control*: For this work night blood filming is carried out by 2 teams, each consisting of a P. H. I. and 2 Filaria Control Assistants, for detection of Micro-filaria positive cases and administration of treatment to positive cases. All treated positive cases are kept under surveillance for 2 years being blood filmed within 10-40 days of completion of treatment and thereafter at 6 monthly intervals. In addition a night blood filming centre is conducted weekly at the M. O. H.'s Office and a clinic held once a week by the M. O. H., Matara, for treatment of clinical cases. *Health Education*: There is a Health Educator, Anti-Filariasis Campaign at Matara. He carries out health education work with other members of the Anti-Filariasis Campaign at Matara. A successful Shramadana Campaign was conducted in September 1965 and the work is being followed up. (*c*) Yes. Action is being taken and it is hoped to establish an Anti-Filariasis Decentralized Unit at Matara for expanding the Anti-Filariasis work by 1.10.67. This decentralized unit would be in charge of a Medical Officer and would have a laboratory with one Medical Laboratory Technologist and 19 Microscopists. In addition 26 Filaria Control Assistants would be appointed to this unit which would enable expansion of parasite control work to 26 Public Health Inspectors' Areas which would include the suburbs of the Matara Town. (*d*) Does not arise in view of (*c*) above.

මාතර නගර සභාවේ ගිණුම් පොත් නැතිවීම

மாத்தறை நகரசபை : கணக்குப் புத்தகங்கள் காணுமற் போதல்

MATARA URBAN COUNCIL : LOSS OF ACCOUNT BOOKS

4. **තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

පළාත් පාලන ඇමතිගේත් ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1967 ජූනි මාසයේ මාතර නගර සභාවේ ගිණුම් පරීක්ෂණ පැවැත්වෙන අතර එහි ගිණුම් පොත් කීපයක් නැතිවුණු බව එතුමා දන්නවාද? (ආ) මේ නැතිවුණු පොත් මොනවාදැයි එතුමා සඳහන් කරනවාද? (ඉ) මේ පොත් යම් කිසිවකු විසින් විනාශ කොට ඇත්තේ සමහර නිලධාරීන් විසින් කරනලද වංචාවන් එළිදරව්වීම වැළැක්වීමට බව එතුමා දන්නවාද? (ඊ) මේ සිද්ධිය සම්බන්ධයෙන් යම්කිසි නිලධරයකුගේ වැඩ තහනම් කොට ඇත්තේ ද? (උ) පරීක්ෂණය පැවැත්වූ නිලධාරීන්ගේ පරීක්ෂණ වාර්තාව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරනවාද? (ඌ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி அமைச்சரினதும் தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினு: (அ) 1967 ஜூன் மாதம் மாத்தறை நகரசபையின் கணக்குகளைப் பரிசோதிக்கும்போது அங்கு பல கணக்குப் புத்தகங்கள் காணுமற்போயின என்பதை அவர் அறிவாரா? (ஆ) காணுமற் போன புத்தகங்கள் எவை என்பதை அவர் குறிப்பிடுவாரா? (இ) உத்தியோகத்தர் சிலர் புரிந்த களவுகள் வெளியாவதைத் தடுக்கும் நோக்குடனேயே சிலரால் இப்புத்தகங்கள் அழிக்கப்பட்டன என்பதை அவர் அறிவாரா? (ஈ) இச் சம்பவத்தின் தொடர்பாக உத்தியோகத்தர் எவராவது சேவையிலிருந்து இடைநிறுத்தம் செய்யப்பட்டனரா? (உ) பரிசோதனை நடத்திய உத்தியோகத்தரின் அறிக்கையை அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா? (ஊ) இன்றேல், ஏன்?

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that in June 1967, while the audit

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

inspection of the Matara U. C. was in progress, a number of account books were lost ? (*b*) Will he state what books were lost ? (*c*) Is he aware that some person has destroyed these books with a view to prevent frauds committed by certain officers being detected ? (*d*) Was an officer interdicted in connection with this incident ? (*e*) Will he table the report of the officers who carried out the inspection ? (*f*) If not, why ?

ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும் தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

(අ) ඔව්. මා වෙත එසේ දන්වා ඇත. (ආ) පැවිරල් නිකුත් කිරීමේ ලේඛනය හා අංක 11 දරන පැවිරෝල් ඇණවුම් පොත නැති වී හෝ සොයාගැනීමට නොහැකි වී තිබෙන බැව් මට දැනගැනීමට ලැබී තිබේ. (ඉ) සියලුම කරුණු මම නො දනිමි. (ඊ) නගර සභාවේ සභාපති විසින් 1967. 6. 13 වැනි දින කම්මාන්ත අංශයෙහි ගබඩා භාර කරුගේ වැඩ තහනම් කරන ලදී. (උ) සහ (ඌ) ඔඩිටර් ජනරාල්ගේ නිලධාරීන් විසින් පරීක්ෂණය පවත්වනු ලැබූ අතර, ඒ පිළිබඳ වාර්තාව මෙම අමාත්‍යාංශයට ලැබී නැත.

පිටරට පවත්වන නාට්‍ය සම්මේලනවලදී ලංකාව වෙනුවෙන් පෙනී සිටීමට රාජකීය කණිෂ්ඨ පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයා තෝරා ගැනීම

வெளிநாட்டு நாடகக் கருத்தரங்குகளில் கலந்துகொள்ள றோயல் கனிஷ்ட பாடசாலைத் தலைமை ஆசிரியரைத் தெரிதல்

SELECTION OF HEAD MASTER, ROYAL JUNIOR SCHOOL, FOR DRAMA SEMINARS ABROAD

5. සී. එන්. මැතිව් මයා. (කොලොන්න)

(திரு. சீ. என். மதியூ—கொலன்ன)

(Mr. C. N. Mathew—Kolonna)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) පිටරට පවත්වන සෑම නාට්‍ය සම්මේලනයකදීම, ලංකාව වෙනුවෙන් පෙනී සිටීමට රාජකීය කණිෂ්ඨ පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයා සෑම විටම තෝරාගනු ලබන්නේ කෙසේ දැයි එතුමා සඳහන් කරනවාද ? (ආ) තේරීම කරනු ලබන්නේ කවරෙකු විසින්ද ? කිනම් සුදුසුකම් පදනම් කර ගෙනද ?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா : (அ) வெளிநாடுகளில் நடைபெறும் நாடகக் கருத்தரங்கங்களுக்கு எப்போதும் இலங்கையைப் பிரதிநிதித்துவப் படுத்த றோயல் கனிஷ்ட பாடசாலைத் தலைமை ஆசிரியரே தேர்ந்தெடுக்கப்படுவது எவ்வாறு ? (ஆ) தேர்ந்தெடுப்பவர் யார் ? தேர்வு எவ் வடிப்படைகளில் அல்லது எத்தகைமைகளைக் கொண்டு நடாத்தப்படுகிறது ?

asked the Minister of Education and Cultural Affairs : (*a*) How is it that the Head Master of Royal Junior School is always selected to represent Ceylon at all drama seminars abroad ? (*b*) Who makes the selections and on what grounds or qualifications ?

ගාමණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) පිට රට පවත්වන සෑම නාට්‍ය සම්මේලනයකදීම ලංකාව වෙනුවෙන් පෙනී සිටීමට රාජකීය කණිෂ්ඨ පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයා සෑම විටම තෝරාගනු ලබන්නේ නැත. එම නිසා ප්‍රශ්නය පැන නොනගී. (ආ) රජය විසින් නියෝජිතයින් නම් කරන විට තේරීම කරනු ලබන්නේ ලංකා කලා මණ්ඩලයේද උපදෙස් ඇතිව් සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සහ අමාත්‍යාංශය විසිනි. සුදුසුකම් ඒ ඒ සම්මේලනයේ මාතෘකාව අනුව වෙනස් වේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොළඹ නගරයේ "රෝහල්" බස් සේවාවක් ඇති කිරීම

கொழும்பு நகருக்கு வைத்திய நிலைய பஸ் சேவை

HOSPITAL BUS SERVICE FOR COLOMBO CITY

6. මැතිව් මයා. (ඒ. පිලපිටිය මයා.—කලවාන—වෙනුවට)

(திரு. மதியூ—திரு. ஏ. பிலப்பிற்றிய—கலவான—சார்பாக)

(Mr. Mathew—on behalf of Mr. A. Pilapitiya—Kalawana)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකාවේ සෑම ප්‍රදේශයකම, රෝහල් කරා ඇදී එන මහජනයාගේ පහසුව තකා "රෝහල්" බස් සේවාවක් යොදා ඇති බව එතුමා දන්නවාද? (ආ) රෝගීන් බැලීමට නියමිත වේලාවන්හිදීත්, දවසේ අනිකුත් සාමාන්‍ය වේලාවන්හිදීත්, ධාවනය වන මෙම බස් සේවයෙන් මහජනයාට විශේෂ පහසුකමක් සැලසෙන බව එතුමා දන්නවාද? (ඉ) එහෙත් දිවයිනේ අගනුවර පිහිටි ප්‍රධාන රෝහල කරා සිව් දිගින් ඇදී එන මහජනයා සඳහා රෝහල් බස් සේවාවක් යොදා නැති බවත්, එසේ නොමැති කමින්, මහජනයාට මහත් හිරිහැරයක් වනවා පමණක් නොව නියමිත වේලාවට රෝගීන් බැලීමට ඒමට පවා නොහැකිවන බවත් එතුමා දන්නවාද? (ඊ) එම නිසා අඩුතරමින්, රෝගීන් බැලීමට නියමිත වේලාවන්හිදීවත් කොළඹ නගරයේ "රෝහල්" බස් සේවාවක් ඇති කිරීමට කටයුතු කරනවාද? (උ) එසේ නම්, කවදා සිටද?

தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கையின் எல்லாப் பகுதிகளிலும் வைத்திய நிலையங்களுக்குச் செல்லும் மக்களின் வசதிக்காக "வைத்திய நிலைய பஸ் சேவை" ஒன்று இருப்பதை அவர் அறிவாரா? (ஆ) நோயாளரைப் பார்வையிடும் நேரங்களிலும், மற்றைய நேரங்களிலும் இயங்கும் இந்த பஸ் சேவையினால் மக்கள் பெரிதும் பயனடைகிறார்கள் என்பதையும் அவர் அறிவாரா? (இ) எனினும் கொழும்பு பெரிய ஆஸ்பத்திரியை நோக்கி நாற்திசைகளில் இருந்தும் வரும் மக்களுக்காக வைத்திய நிலைய பஸ் சேவை எதுவும் இல்லையென்பதையும், அதனால் பொது மக்கள் பெருந் துன்பத்திற்காளாவதோடு உத்தியோகபூர்வமான பார்வையாளர் நேரத்தில் நோயாளிகளைப் பார்க்க வர முடியாமலிருப்பதையும் அவர் அறிவாரா? (ஈ) எனவே உத்தியோகபூர்வமான பார்வையாளர் நேரத்திலாவது கொழும்பு மாநகரத்தில் வைத்திய நிலைய பஸ் சேவை ஒன்றை ஆரம்பிக்க நடவடிக்கை எடுப்பாரா? (உ) ஆமெனில், எப்பொழுதிருந்து?

asked the Minister of Nationalized Services: (*a*) Is he aware that a "Hospital Bus Service" has been provided in every part of Ceylon for the convenience of members of the public who visit hospitals? (*b*) Is he aware that this bus service which operates during hospital visiting hours as well as during other normal hours of the day provides a special facility for the public? (*c*) Is he aware that no bus service has, however, been provided for members of the public who come from all parts of the country to the General Hospital, Colombo, and that as a result, members of the public are not merely put into inconvenience but are also prevented from visiting patients in the hospital during official visiting hours? (*d*) Will he therefore provide a Hospital Bus Service in the city of Colombo at least during official visiting hours? (*e*) If so, from when?

ගරු ඩී. බී. වෙලගෙදර (වැඩ බලන ජනසතු සේවා ඇමති)

(கௌரவ டீ. பி. வெலகெதர—பதில் தேசியமய சேவை அமைச்சர்)

(The Hon. D. B. Welagedera—Acting Minister of Nationalized Services)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) නැත. දිවයිනේ සෑම ප්‍රදේශවල සිට ම විශේෂයෙන් ම කොළඹ මහාරෝග්‍යශාලාව කරා ධාවනය කරන සේවා සැලසිය නොහැකියි. එතකුදු වුව ද මහජනයාට බස්රථ කීපයකට මාරු නොවී මහාරෝග්‍යශාලාවට යාමේ පහසුකම් දැනට තිබෙන සේවාවලින් සැලසී ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. බී. වෙලගෙදර]

(ඊ) දිනට ධාවනය වන බස් සේවාවලින් ලෙඩුන්ට හා ලෙඩුන් බැලීමට යන අයට ගමනාගමන පහසුකම් සැලසී ඇත. (උ) පැන නොනගී.

නියෝජ්‍ය කථානායකතුමා

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

7 වන ප්‍රශ්නය.

ගරු වන්නිනායක

(கௌரவ வன்னிநாயக்க)

(The Hon. Wanninayake)

එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

Question No. 8.

එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. M. H. M. Naina Marikar—Parliamentary Secretary to the Minister of Justice)

I want two weeks' time to answer the Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

ශෝක ප්‍රකාශය: ආචාර්ය ඩබ්ලිව්. ටී. ස්ටේස්

அனுதாபத்தீர்மானம் : டொக்டர் டபிள்யூ. ரீ. ஸ்ரேஸ்

VOTE OF CONDOLENCE : DR. W. T. STACE

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)

(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

Mr. Deputy Speaker, with your permission I wish to refer to the passing away in California of Dr. Walter Terrence Stace, former Member of the Legislative Council, and of the Governor's Executive Council. He was a member of the old Ceylon Civil Service, and I believe he held many offices in the Legislative Council and the Executive Council. He was Controller of Revenue and also Mayor of Colombo. I believe Stace Road in Colombo is named after him. He had a distinguished career in Ceylon, and after his retirement he was Professor of Philosophy at Princeton University in the U. S. A.

On behalf of the Members of this House I wish to record our regrets at his passing away and request you to direct the Clerk to send a copy of the proceedings to the members of the bereaved family.

මෛත්‍රීපාල සේනානායක මයා. (මැදවච්චිය)

(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)

(Mr. Maithripala Senanayeke—Medawachchiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභාවප්‍රාප්ත වූ ආචාර්ය ඩබ්ලිව්. ටී. ස්ටේස් මහතා පිළිබඳව විරුද්ධ පාර්ශ්වයේ ශෝකයත්, විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. අධිරාජ්‍යවාදී යුගයේ සිවිල් සේවයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවකයකු වුණත්, එවකට තිබුණු මණ්ඩලයේ මන්ත්‍රීවරයකු වශයෙන් සිටි ඒ මහතාගේ අභාවය ගැන සාමාන්‍ය සම්ප්‍රදාය අනුව අපේ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන අතරම ඒ මහතා පිළිබඳව පෞද්ගලික වශයෙන් වැඩිදුරටත් කරුණු දක්වීමට නොහැකි වීම ගැන මා කනගාටු වෙනවා. සභානායකතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව අනුමත කරන අතර අපේ ශෝකයද මේ සමගම ප්‍රකාශ කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of Dr. Walter Terrence Stace, former Member of the Legislative Council. I shall request the Clerk of the House to make a minute of the proceedings of the meeting today and send a copy thereof to the members of the bereaved family

කෙටුම්පත් පණත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

BILL PRESENTED

පොල් කෙඳි පනත් කෙටුම් පත

தென்னந் தும்பு மசோதா

COCONUT FIBRE BILL

"to regulate, encourage and assist the development of the coconut fibre industry in Ceylon and the export of coconut fibre and coconut fibre products from Ceylon, and to make provision for matters connected therewith or incidental thereto."

පිළිගන්වන ලද්දේ වාණිජ හා වෙළඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට වැඩබලන ජනසතු සේවා ඇමති ගරු ඩී. බී. වෙලගෙදර විසිනි. 1967 අගෝස්තු 23 වන බදාදා දෙවන වර කියවිය යුතු යයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

வர்த்தக, வியாபார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி சார்பாக கௌரவ டீ. பி. வெலகெதர அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1967 ஒகஸ்ட் 23 ஆம் தேதி, புதன்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

Presented by the Hon. D. B. Welagedara, Acting Minister of Nationalized Services, on behalf of the Parliamentary Secretary to the Minister of Commerce and Trade; to be read a Second time upon Wednesday, 23rd August 1967, and to be printed.

විසර්ජන කෙටුම්පත් පනත, 1967-68

ஒதுக்கீட்டு மசோதா, 1967-68

APPROPRIATION BILL, 1967-68

කාරක සභාවේදී සලකා බලන ලදී.—[ප්‍රගතිය අගෝස්තු 21.]

[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப் பெற்றது. [தேர்ச்சி, 21 ஒகஸ்ட்].

[உப சபாநாயகர்] அவர்கள் தலைமை தாங்கினார்கள்.

Considered in Committee.—[Progress, 21st August.]

[MR. DEPUTY SPEAKER *in the Chair.*]

14 වන ශීර්ෂය.—රාජ්‍යාරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා

1 වන සම්මතය :—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 4,08,51,757

14 ஆம் தலைப்பு.—பாதுகாப்பு, வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 4,08,51,757

HEAD 14.—MINISTER OF DEFENCE AND EXTERNAL AFFAIRS

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 40,851,757

ඉදිරිපත් කරන ලද සංශෝධනය.—[අගෝස්තු 21]

" වැය සම්මතය රු. 10 කින් අඩු කළ යුතුය."—[ආචාර්ය එන්. එම්. පෙරේරා.]

பிரேரிக்கப்பட்ட திருத்தம்—[21 ஒகஸ்ட்] :

" வாக்குப்பணத்தில் ரூபா 10 குறைக்கப்படுமாக."—[கலாநிதி என். எம். பெரேரா]

Amendment moved.—[21st August] :

"That the Vote be reduced by Rs. 10."—[*Dr. N. M. Perera*]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

Question again proposed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.15

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

ගරු සභාපතිතුමනි, ඊයේ මගේ කථාව අවසන් කරන විට මා සඳහන් කරමින් සිටියේ අපේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධවයි. අද දින මා පළමුවෙන්ම බලාපොරොත්තු වෙනව, යුක්තිය ඉෂ්ට නොවූ කරුණු තුනක් ගැන අකුරැස්සෙ මන්ත්‍රීවරයා වශයෙන් ගරු අගමැතිතුමාගෙ අවධානය යොමු කිරීමට. විශෙෂයෙන්ම පොලිසියෙන් සහ රජයේ වෙනත් දෙපාතීමේන්තුවලින් විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන්ට නියම යුක්තිය ඉෂ්ට කර ගැනීමට නුපුළුවන් තත්ත්වයක් දැන් ඇති වී තිබෙන බවට සාධක වශයෙන් කරුණු ගෙන හැර දැක්වීමට මා අදහස් කරනවා.

පසුගිය මහා මැතිවරණයෙන් පසු පොලීසිය විසින් කරන ලද දූමරික ක්‍රියාවන් සම්බන්ධව මේ ගරු සභාවේදී ඉතාමත් වේගවත් විවාද ඇති වූ බව තමුන්නාන්සේ දන්නවා. මාත් එක් කරුණක් ගැන ඒ දවස්වල ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කළා. අකුරැස්සේ පොලිස් ස්ථානාධිපති සම්බන්ධයෙන් නියම පරීක්ෂණයක් ඇති කරවන මෙන් එදා මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලූ අතර එසේ ඉල්ලීමට හේතු වූ කරුණුත් දක්වා සිටියා. ගරු අගමැතිතුමා වරක් ඒ සම්බන්ධයෙන් මට එවූ ලියමනක මේ අන්දමට සඳහන් කර තිබෙනවා:

"1965 අගෝස්තු 20.

ප්‍රිය දෙස්තර වික්‍රමසිංහ මහතාණෙනි,

ජූනි 1 වන දින මගේ ලිපියට අමතර වශයෙනි. මගේ උපදෙස් පිට මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඇති බැව් දන්වමි. මා වෙත එවා ඇති වාර්තාව සම්පූර්ණයෙන්ම නිවැරදි නොවන බැව්ද, වාර්තාවෙහි දිනයට ප්‍රථමයෙන් ඔබ විසින් සාක්ෂිකරුවන් සමහරක් ඉදිරිපත් කර ඇති බැව්ද මට පෙනේ. මේ සම්බන්ධයෙන් මම සුදුසු පරිදි කටයුතු කරමි.

1965 අප්‍රේල් මස 28 වන දින මගේ ලිපියෙන් ඔබ වෙත දන්වන ලද පොලිස් වාර්තාවෙහි වැරදි ප්‍රකාශයක් සඳහන් වීම ගැන මම කණගාටුවෙමි.

ඔබේ හිතවත්,
ඩඩ්ලි සේනානායක,
අගමැති.

පාර්ලිමේන්තු මන්ත්‍රී
දෙස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ මහතා."

පොලිසියේ වාර්තාගත වී තිබුණු අන්දමට පොලිසියෙන් යවන ලද වාර්තාවේ කොපියක් ගරු අගමැතිතුමා මට එව්වා. ඒ කොපියේ තිබෙන්නේ මෙන්න මේ ආකාරයටයි:

"මේ සම්බන්ධයෙන් වික්‍රමසිංහ දෙස්තර මහතා විසින් පැමිණිල්ලක් කරන ලදී. එම චෝදනාව අකුරැස්ස පොලීසිය නොපිළිගනියි. සාක්ෂ්‍යකරුවන් ඉදිරිපත් කිරීමට වික්‍රමසිංහ දෙස්තර මහතා භාර ගත් නමුත් ඔහු මෙතෙක් එසේ කර නැත. මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් වාර්තාවක් සැපයෙනවා ඇත."

මෙය සම්පූර්ණ අසත්‍යයක් බව ගරු අගමැතිතුමා දන්නවා. මෙය මට කරන ලද අපහාසයක්. මා ඒ විභාගයේදී සාක්ෂ්‍යකරුවන් ඉදිරිපත් කළා. විභාගය පැවැත්වීමට පැමිණි නිලධාරියා සාක්කිකරුවන් සියලුදෙනාගෙන්ම කරුණු ඇසුවේ නැහැ. චෝදනාව සම්පූර්ණයෙන්ම ඔප්පු වුණාය; ඒ නිසා මීට වඩා සාක්කිකරුවන් කැඳවන්නට වුවමනාවක් නැත යනුවෙන් ඔහු ප්‍රකාශ කළා. ඒ අනුව අනෙකුත් සාක්ෂ්‍යකරුවන්ගෙන් විමසන්නේ නැතිව ඒ අය ආපසු යැව්වා. ප්‍රමාණයට වඩා සාක්කිකරුවන් වුවමනා නැතැයි කී නිසා—වුවමනා තරමට සාක්කිකරුවන් කරුණු කියා ඇති නිසා—ඉතිරි පිරිස පිටත් කර හැරියා. ගරු අගමැතිතුමා මෙය පිළිගෙන එතුමාගේ කනගාටුව ප්‍රකාශ කර තිබෙනවා. පොලීසියෙන් ආ වාර්තාවක මේ විධියේ වැරදි අවබෝධයක් දෙන ආකාරයට කරුණු සඳහන් වෙනවාය කියමින් ඒ ගැන එතුමාගේ කණගාටුව මා වෙත ප්‍රකාශකර තිබුණා. ඒ ගැන මා ගරු අගමැතිතුමාට ස්තුති කරනවා. වරදක් වුණාම සාමාන්‍ය ශිෂ්ඨ සම්මත ප්‍රතිපත්තියක් අනුව ඒ වරද පිළිගැනීම ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. එහෙත් පොලීස් ස්ථානාධිපති සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද චෝදනා—ඔප්පු කළ චෝදනා—සම්බන්ධව අද වනතුරු කිසිම විභාගයක් කර නැහැ. මේ පොලීස් ස්ථානාධිපතිම තමයි ඊට පසු තවත් උසස් ස්ථානයකට පත් කර යැව්වේ. බණ්ඩාරවෙල අතුරු මැතිවරණයේදී විශාල ලෙස මර්දන වැඩ කටයුතු සංවිධානය කර තිබුණේ ඒ පොලීස් ස්ථානාධිපතිමයි.

මෙවැනි දේවල් සිද්ධ වීමට එක් වැදගත් හේතුවක් තිබෙන බව මතක් කරන්නට ඕනෑ. මේ පොලීස් ස්ථානාධිපති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්බන්ධයෙන්ම 1965 මාර්තු මාසයේ 30 වැනි අඟහරුවාදා "දිනමිණ" පත්‍රයේ මේ ආකාරයට පළ කර තිබුණා :

"ඩඩ්ලි සේනානායක මහතා අගමැතිවීමේ ප්‍රීතිය නිමිත්තෙන් අකුරැස්ස සුළු නගර සභා භූමියේ පවත්වන ලද උත්සව සභාව අවසානයේදී මහා සංගීත සන්දර්ශණයක් සහ ගිනිකෙළි ප්‍රදර්ශනයක් පැවැත්විණි. කොළ සහ සුදු පැහැති ඇඳුම්න් සැරසී පෙළපාළියෙන් සහ පෙරහැරින් පැමිණි ස්ත්‍රී පුරුෂ විශාල සංඛ්‍යාවක් උත්සව සභා භූමියට රොක්වූහ. අකුරැස්ස පොලිස් ස්ථානාධිපති කේ. අරඹෙවෙල, සුළු නගර සභාපති ඩී. ඒ. සූරියආරච්චි සහ මේජර් සී. ඒ. ධර්මපාල යන මහත්වරුද මෙයට සහභාගි වූහ."

මා කියැවූ ආකාරයට වාර්තාවක් "දිනමිණ" පත්‍රයේ පළ කර තිබුණා. ඒ උත්සව සභා රැස්වීමට පොලිස් ස්ථානාධිපතිවරයාත් පැමිණ සිටි බව ඒ ප්‍රවෘත්තියෙන් කියැවෙනවා.

අකුරැස්සේ එක්සත් ජාතික පක්ෂය විසින් අගමැතිතුමාට පිළිගන්වන ලද සන්දේශයක අවසානයේ මෙන්න මේ කොටස අඩංගු වෙනවා :

"රුහුණේ අවංක අසහාය ජනනායක සේනාධිපති සී. ඒ. ධර්මපාල මහතා අකුරැස්සේ එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා වශයෙන් අපි එකහෙළා පිළිගන්නා අතරම දහ හත් වර්ෂයක් අඳුරේත් අඳුරට පත් කර ඇති අකුරැස්ස ආසනයේ දියුණුවට තමුන්නාන්සේගේ රජයෙන් දිය හැකි සෑම ආධාරයක්ම එතුමාට දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු."

ධර්මපාල මහත්මයාට අකුරැස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියට ආධාර දෙන්නැයි ඉල්ලන මේ සන්දේශයට අත්සන් කර තිබෙන්නේ අකුරැස්සේ එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයා වන එම්. ආර්. ජී. පේමදාස.

දරුණු චෝදනාවලට ලක් වූ මේ පොලිස් ස්ථානාධිපතිවරයා සම්බන්ධව අද වනතුරු ක්‍රියා කර නැහැ. ඒ ගැන ගරු අගමැතිතුමාට මතක් කරනවා. මීට පෙරත් මතක් කළා. එහෙත් ගරු අගමැතිතුමාට එය අමතක වෙන්නටත් ඇති. හිතුමනාපයේ එය අමතක කළාය කියා හෝ යටපත් කළාය කියා හෝ මා ගරු අගමැතිතුමාට චෝදනා කරන්නේ නැහැ. වෙනත් බලපෑම් උඩ මෙය යටපත් කර තිබෙනවා. පොලිස් ස්ථානාධිපති කළ දූෂණ අපරාධ හා හිංසා පිළිබඳව පරීක්ෂණවලදී කාරණා ඔප්පු වුණු හෙයින් මෙය යටපත් කළා. මෙවැනි නින්දිත කටයුත්තක් සම්බන්ධයෙන් අගමැතිතුමා පෞද්ගලිකව අත ගැසූ බවක් මා කියන්නේ නැහැ. කෙසේ වෙතත් මේ ගැන පරීක්ෂා කර බලන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මාලිම්බඩ ගම්කාර්ය සභාපති හෙන්රි අලස් මහතාගේ වත්තේ අවුරුදු පතා විශාල සූදුවක් පවත්වනවා. දාහක්, දෙදහක් ඒ සූදුවට සහභාගි වෙනවා. හරක් මස් තම්බා අරක්කු ගෙනැවිත් ජයටම ඒ සූදුව පවත්වනවා. මේ අවුරුද්දේ බොහොම මහන්සි වී එඩිතර පොලිස් උප සුපිරින්ටෙන්ඩන්ට් කෙනකුගේ සහාය ඇතිව මෙම සූදුව ඇල්ලුවා. කෙසේ වෙතත් මෙතැන විශාල පිරිසක් සූදු කෙළින බව ඒ පොලිස් නිලධාරීන් පිළිගත්තේ නැහැ. ඒ නිසා එක් පොලිස් වෑන් රථයකින් පමණක් පොලිස් භටයන් එහි ගෙන ගියා. වෑන් හතක අටක පොලිස් භටයන් නංවාගෙන ගොස් වට කළහොත් විශාල ගණනක් අල්ලා ගන්නට පුළුවන් බව මා කීවා. මෙම සූදුව පවත්වාගෙන යන්නේ ආණ්ඩුවේ ආධාරය ඇතිව බවට හැඟීමක් තිබෙන නිසා අපරාධ මර්දනය සඳහා සිටින පොලීසිය ඒ අපරාධය මැඩ පැවැත්විය යුතු බව මා කීවා. එදා එහි ගිය පොලිස් නිලධාරීන් ටික දෙනාට සූදුකාරයන් තිස් දෙනකු අල්ලා ගන්නට පුළුවන් වුණා. ඒ අල්ලා ගනු ලැබූ සියලු දෙනාම වැරදිකාරයන් වුණා. එහි ගිය පොලිස් භටයන්ගේ අතට අසුවුණු මිනිසුන්ගේ ගණන තිහයි. ඒ හැර කඩදාසි කුට්ටම් ගණනාවක් එකතු කරගෙන තිබෙනවා. මුදල් එකතු කරගෙන තිබෙනවා. අරක්කු බෝතල් ගණනාවක් එකතු කරගෙන තිබෙනවා. වැරදිකාරයන් වූ සියලු දෙනාටම දඩ ගැසුවා. එහෙත් හෙන්රි අලස් මහතාට කිසිම දඬුවමක් නැහැ. සූදුව පැවැත්වුණේ ඔහුගේ වත්තේ. ගම්කාර්ය සභාපතිවරයකු වූ ඔහු එක්සත් ජාතික පක්ෂයේ ද් ‍ ාය‍කු නිසා ඔහුට විරුද්ධව ක්‍රියා කර නැහැ. සූදුව සම්බන්ධයෙන් නීති පොතෙහි කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ඇති දේ කියවන්නට මා කැමතියි. නීතිඥයකු නොවුණත් මා එය කියවන්නට කැමතියි.

"3. Whoever—

(a) being the owner or occupier, or having the use temporarily or otherwise thereof, keeps or uses a place as a common gaming place; or

(b) permits a place, of which he is owner or occupier, or of which he has the use temporarily or otherwise, to be kept or used by another person as a common gaming place; or

(c) has the care or management of, or in any manner assists in the management of, a place kept or used as a common gaming place,

shall be punished with fine not exceeding five hundred rupees, or with rigorous imprisonment for a term which may extend to one year, or with both."

මේ කියන ලද රෙගුලාසිය අනුව හෙන්රි අලස් මහතා වරදකරුවකු බව අමුතුවෙන් කියන්නට වුවමනාවක් නැහැ. සූදුව පැවැත්වුණේ ඔහු පදිංචි වලව්ව පිහිටි ඉඩමේයි. කොටින්ම ඔහුගේ ගෙදරයි. යමකු පදිංචි ගෙදර සූදුවක් කෙරුණොම ඔහුටත් ඒ ගැන වගකීමක් තිබෙනවා. එහෙත් ඔහුට විරුද්ධව ක්‍රියා කර නැහැ. ඔහු ගම්සභාපතිවරයෙක්; දේශපාලන පක්ෂයක ප්‍රධානයෙක්. ඔහුගේ වත්තේ සූදුව පැවැත්වුණා. ඒ සූදුව ඇල්ලුවා. අල්ලා ගනු ලැබූ තිස් දෙනාම වැරදිකාරයන් වුණා. එහෙත් සූදුව පැවැත්වුණු ස්ථානය අයිතිකරු එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධානයකු නිසා ඔහුට විරුද්ධව නඩු පවරා නැහැ. අවුරුදු විස්සක් තිස්සේ මෙම දූෂණය කර ගෙන යන ඔහුට විරුද්ධව තවම ක්‍රියා කර නැහැ. එසේ හෙයින් මේ ගැන විශේෂයෙන් සොයා බලන ලෙස මා මතක් කරනවා.

මට තව කරුණක් මතක් කරන්නට තිබෙනවා, අතුරලිය උප තැපැල් කාර්යාලය පිළිබඳව—එම උප තැපැල් කාර්යාලයේ උප තැපැල් මහතාට අස් වන්නට සිදු වීම ගැන. [බාධා කිරීමක්] අතුරලිය උප තැපැල් කාර්යාලය ප්‍රධාන තැපැල් කාර්යාලයක් නැතිනම් සපිරි තැපැල් කාර්යාලයක් බවට පත් කළා. තැපැල් සේවාව භාර ඇමතිවරයා වැරදි අන්දමට සහ හිරිහැර සිදු වන අන්දමට ක්‍රියා කිරීම පිළිබඳව මා ගරු අගමැතිතුමාටත් දන්වා යවා තිබෙනවා. ඒ ගැනයි, මෙම අවස්ථාවේදී සඳහන් කරන්නට අදහස් කරන්නේ. 1967 මාර්තු 28 වන දින ගරු අගමැතිතුමාගෙන් මට ලැබුණු පිළිතුරක මෙසේ සඳහන් වෙනවා:

"..........පෝස්ට් මාස්ටර් ජෙනරාල් විසින් කරන ලද පරීක්ෂණ වලින් පෙනී ගියේ නොයෙක් වෙනස්කම් නිසා උප තැපැල් කාර්යාලයට පැමිණෙන ඇතැම් අයවළුනට එම භූමියේදී දුෂ්කරතා ඇති වන බවය."

ඒ පිළිබඳව මා තර්ක කරන්නේ නැහැ. ඒක නොවෙයි, ප්‍රශ්නය. ඊළඟට එහි මෙසේ ද සඳහන් වෙනවා:

"..........ඒ අනුව, ප්‍රාදේශීය තැපැල් අධිකාරීන් විසින් නිර්දේශ කරන ලද වෙනත් තැනකට උප තැපැල් කාර්යාලය ඉවත් කරන ලෙස 1965.7.20 දින උප තැපැල් ස්ථානාධිපතිට උපදෙස් දෙනු ලැබිණ. පෝස්ට් මාස්ටර් ජෙනරාල්ගේ උපදෙස් උප තැපැල් ස්ථානාධිපති විසින් ක්‍රියාත්මක නොකරන ලදී."

අන්න ඒ ප්‍රකාශය නීති විරෝධියි. උප තැපැල් මහතාට එවන ලද ලිපිය මෙසේයි:

"අතුරලිය උප තැපැල් කාර්යාලය දැනට පිහිටි ස්ථානයේ සිට යාර 440ක් පමණ දුරින් පිහිටි ඉහළ අතුරලිය විවිධ සේවා සමුපකාර ගොඩනැගිල්ලේ අංශයකට ගෙන යාමට පෝස්ට් මාස්ටර් ජනරාල් තුමා නියෝග කර ඇත. 1965.9.6 දින මෙම කාර්යාලය යෝජිත ගොඩනැගිල්ලට ඔබ විසින් ගෙන යා යුතුය. බඩු ගෙන යාම සඳහා යන වියදම දෙපාර්තමේන්තුව විසින් දරණවා ඇත. මෙ දිනම ටෙලිෆෝනය යෝජිත ගොඩනැගිල්ලට ගෙන යාමද මාතර දි. වි. ස. ප. ක්‍රියා කරනවා ඇත.

අත්සන් කළේ/ප්‍රාදේශීය තැපැල් අධිකාරි,
ගාල්ල.

උප තැපැල් කාර්යාලය තනවා ගැනීම උප තැපැල් ස්ථානාධිපතිට අයත් වගකීමක්. තමන්ට සුදුසු තැනක් යොදා ගන්නටය කියා නීතියෙන් කියා තිබෙනවා. එහෙත් මෙම ලිපියෙන් නියම කරනවා, යම් කිසි තැනකට ගෙන යන්නටය කියා. ගාල්ලේ කුලරත්න මහතාගේ භාර්යාව මියයාම පිළිබඳව ලොකු පරීක්ෂණයක් කරගෙන යනවා වාගේ දැනට මෙම ගෙය අයිතිකාරයාගේ භාර්යාවත් වස දී මැරුණාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන ප්‍රශ්නය උඩ විශාල විභාගයක් පොලීසිය මගින් කර ගෙන යන බව පෙනෙනවා. සමාජයේ විශාල අපරාධ කරන [බාධා කිරීමක්] ඒ පුද්ගලයාගේ කල්ක්‍රියාව කෙසේ වෙතත් මා කියා සිටින්නේ මෙයයි: කාර්යාලයට සුදුසු ගෙයක් සොයා ගැනීමේ වගකීම පැවරී තිබෙන්නේ උප තැපැල් ස්ථානාධිපති මහතාටයි. එහෙත් තමන්ගේ තැපැල් කන්තෝරුවේ මුදල් තමන්ට විශ්වාස නැති කාගෙවත් ගෙදරකට ගෙන යන්නැයි ඔහුට නියම කිරීම නීති විරෝධියි. උප තැපැල් ස්ථානාධිපති වරයා වශයෙන් පත් කරන තැනැත්තා ආණ්ඩුව මගින් අනුමත කරනු ලබන විධියේ කාර්යාලයක් සපයා ගන්නට ඕනෑ. "සුදුසු තැනක් සකස් කර ගන්නම්; බද්දට සුදුසු ගෙයක් ගැනීම අපහසු නම් මේ කටයුත්ත සඳහා මා ගෙයක් හදාගන්නම්" යනාදි වශයෙන් ඔහු ප්‍රකාශ කළා. එහෙත් ඔහුට නියම කර තිබෙනවා, විශේෂ පුද්ගලයකුගේ ගෙදරකට එම කාර්යාලය ගෙන යන්නටය කියා. මෙම නීති විරෝධි ක්‍රියාව පිළිබඳව මේ වන තුරු කටයුතු කර නැහැ. ගරු අගමැතිතුමාත් මේ පිළිබඳව දන්නවා. මා මෙහිලා එම කාරණය සඳහන් කරන්නට යෙදුණේ නිසි පරීක්ෂණයක් ඇති කිරීම අවශ්‍ය බව සඳහන් කරන්නට මෙන්ම බොහෝ දෙනාට මුහුණ පාන්නට සිදු වී තිබෙන දුෂ්කරතාවයන්ද පෙන්නුම් කර දීම සඳහායි. මේ පිළිබඳව මීට වඩා කරුණු ඉදිරිපත් කරන්නට මා අදහස් කරන්නේ නැහැ.

පූ. භා. 10.30

තව එක කාරණයක් කෙටියෙන් සඳහන් කරන්නට තිබෙනවා. එය යාපනය ප්‍රදේශයට බලපාන දෙයක් නිසා මා ඉංග්‍රීසියෙන් ඒ ගැන සඳහන් කරනවා.

This is about the persecution of members of the minority communities in the Jaffna Peninsula by certain sections of the people there. This perserution is most severe in the Achchuveli, Kodikamam and Chankanai areas.

As you are aware, Sir, the Prevention of Social Disabilities Act was passed about ten years ago, and these people who are ostracized from society and have no right to enter public like temples and so on, have sometimes exercised their rights. They have walked into places like barbers' saloons and when they were refused entry the police have taken action and the courts have meted out Justice to them. Steps have been taken without any discrimination against those who were denying them elementary civil amenities.

As a result of this, a situation has arisen where some sections of the so-called high caste people have started terrorizing the members of these communities because the so-called high caste people are in the majority. The position is so serious in certain areas that the very livelihood of the people belonging to the so-called depressed classes has been seriously affected by the destruction of the tali-pot-palm flower. They cannot do any toddy tapping. In various areas various methods are used to terrorize these people. Sometimes they are brutally assaulted.

I do admit that the persecution of members of the so-called low castes by those of the so-called high-castes is not a feature particular to the Jaffna Peninsula. But it appears that this persecution takes place in the Jaffna Peninsula on an extensive scale. For instance, in our area in the South, there are sporadic outbursts of this caste feeling in certain villages where the so-called low-caste people live. Sometimes they are not allowed to wear any upper garment. There have been occasions when such persons have been harassed and assaulted, and their houses burnt.

My point is that this is not a problem in the South where the situation has been effectively tackled as a result of the police co-operating with the law-abiding people of those areas. It is not a social problem, generally, in Sinhalese areas.

On the other hand, in Jaffna it is still a real social problem, and for any effective steps to be taken to solve this problem I think certain persons of the police force stationed in those areas must be moved out. The great majority of police officers are persons

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

who are prepared to protect the legitimate rights of the citizens, but among them there are certain persons who belong to the so-called high caste and who encourage and protect some of these people who resort to terrorism.

So I appeal to the Government to put under way a special investigation of the problem which has assumed very serious proportions because the very livelihood of the so-called depressed people is being adversely affected by this campaign of some of the so-called high-caste people.

Now, Sir, I would like to mention a few facts about the Army. At Panagoda, one of the centres of the Army, a surgery has been constructed, to be equipped with elaborate equipment imported at a cost of about a lakh of rupees, and also a surgeon and an anaesthetist have been trained. But it would appear from the information I have that the expensive equipment is still in crates, and all the surgical treatment is given at the General Hospital, Colombo, with the result that both the surgeon and the anaesthetist, I am given to understand, have practically no work.

Then there are twelve medical officers in the Army. One of them is stationed in Panagoda, one in Diyatalawa and all the others are in Colombo where there is the least number of army units. I cannot understand what useful purpose these medical officers in Colombo serve. Then the Navy and the Air Force have separate medical services.

I would urge the Hon. Prime Minister to see that the medical services of at least these three services are integrated into one because we do not have a large Army or a large Navy—actually our Navy operates on land ; we do not have any naval boats now. An integrated medical service for these three services can be very much more economical and effective. The proportion of civilian staff to military staff in Ceylon is the highest in the world. In the Air Force the proportion of civilian staff to uniformed staff is 1 : 1 while in the Army it is 1 : 6. This means that one medical institution for the Army, the Navy and the Air Force can be better organized, run more efficiently and with less cost to Government. I think the expenditure on medical services for the Army, Navy and Air Force is considerable : most of it is a waste.

There is a practice now to condemn vehicles which have been four years in use. I am reliably informed that vehicles thus condemned in the current year are towed away by vehicles condemned in the previous year. This is a big racket. We have never had active service in Ceylon for any of the three services and I do not see any reason why military vehicles should not be used for 20 years if they are properly serviced. There is no need to change vehicles every four years. I can understand the need to get artillery and other weapons replaced by modern weapons. I would ask the Hon. Prime Minister to look into this.

There is also the question of a large number of officers who are not competent or who have not had special training. I understand that there is a considerable amount of fraud going on in the services mainly because the officers responsible are not trained to keep proper accounts. In other countries the Army recruits chartered accountants but in Ceylon specialized knowledge is not essential and they get promotions for reasons other than merit. That leads to a considerable amount of inefficiency.

In the Army, for the supervision and maintenance of the vehicles there should be a trained mechanical engineer who could be in charge of the costly vehicles and other machinery. The principle followed, I understand, is to promote on grounds other than efficiency and merit.

We are all aware, and I think the Hon. Prime Minister is also aware, that four officers, namely, Captain D. U. Weerasinghe, Captain P. Dahanayake, Captain A. R. Wijeratne and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Warrant Officer Mendis, who were jailed and then remanded and had to face a trial, have been discharged as there was absolutely no evidence against them. But up to date they are still under interdiction and on half-pay. They are denied medical facilities although they are in the permanent service. In other countries service personnel under punishment are afforded medical facilities until they are discharged finally. This is an elementary right which even prisoners-of-war enjoy. Why should these officers be denied medical facilities? They are denied even the elementary privilege of enjoying medical facilities at the military hospital. That is all that I want to say about the Army.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I thought that was all that the hon. Member had to say.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

I shall finish, Sir, after quoting a passage from the "Times of Ceylon" of 13th December 1966, regarding the policy that has been followed by this Government in common with several other Governments in Asia.

This is a report of the meeting of the recipient counrties of the Colombo Plan that took place early this year. This is what the Times report despatched from Karachchi says:

"Aid recipient are beginning to grumble. Seemingly ungrateful at first blush, they do have a point, however.—

That is what the report says.

——About half of what they get today flows back to the donors in the form of interest on earlier loans.

Complaints about this invisible undercurrent in the aid tide came up again and again at the 24-nation ministerial meeting of the Colombo Plan held recently.

'Unless something is done to reverse the trend', said the Pakistani planning chief, Mr. M. M. Ahmed, who chaired the meeting, 'the debt explosion may prove even more serious than the population explosion.'

Mr. Ahmed was obviously speaking for the recipient countries in general when he spelt out the facts coldly: 'The debt burden of developing countries has increased from ten billion dollars in 1956 to forty billion dollars in 1965 and the annual debt servicing charge has increased from 800 million dollars to 3.5 billion dollars over the same period.'

In other words today 50 per cent of the total aid is flowing back to the donors. The rate of increase in service charge—about 12 per cent. per annum—is far above the rate of growth in export earnings; as a result the ratio of debt services to export has risen from 4 per cent in the mid-fifties to 14 per cent in 1965. The figures are flashing red signals. . . . .

'Aid could create as many problems as it endeavours to remove' one delegate said sagely."

I only mention this because this Government is following the policy, with regard to the Consortium and Commodity Aid, of not examining a gift horse in the mouth. Large consignments of goods are being received as commodity aid and the service charges of these loans that are accumulated are creating a very serious problem. I am not quoting any Opposition sources but some sources that are participating in this imperialist tie up.

පූ. භා. 10.45

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

සභාපතිතුමනි, මෙම වර්ෂය යටතේ කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට බලා පොරොත්තු වන මා පළමුවෙන්ම වර්තමාන පොලිස්පතිතුමාට ප්‍රශංසා කරන්න කැමතියි, ඔහු ඒ පදවියට පත් වුණාට පසුව කරගෙන යන රාජකාරිය ගැන. විශේෂයෙන්ම බුකී සංහාරය ගැනත්, ඒ වාගේම කළුකඩ සංහාරය ගැනත් එතුමා නිර්භයව ක්‍රියා කරන ආකාරය කාට වුවද ධෛර්යයක් ඇති වීමට හේතුවක්. එමෙන්ම ඒ රාජකාරිය දිගටම ඒ අන්දමට කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
ගෙන යාමට ඔහුට ඉඩ ලැබේවියයි මා බලාපොරොත්තු වෙනවා. මා එසේ ප්‍රකාශ කරන්නේ අගමැතිතුමාට චෝදනාත්මක සවරූපයක් ආරෝපනය කිරීමට නොවෙයි. මෙවැනි රාජකාරිවලට නොයෙක් විධියේ බලපෑම් ඇති කරන පුද්ගලයන් දැන් ඉදිරිපත් වී සිටින නිසා පොලිස්පතිතුමාට ඒ රාජකාරිය හරිහැටි කරන්නට අවස්ථාවක් නොලැබෙන්නට ඉඩ ඇති නිසයි. එම නිසා ඒ රාජකාරිය හරි හැටි කිරීමට ශක්තියත් ධෛර්යයත්, ආධාරත් ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

පොලිසියේ රාජකාරිය හරිහැටි ඉටු කිරීමට නොලැබෙන පරිදි නොයෙකුත් බලපෑම් තිබෙන බවට සෑම අවස්ථාවකදීම චෝදනා තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ චෝදනාව සාමාන්‍යයෙන් ආණ්ඩුවට එල්ලවන එකක්. ඒ කෙසේ වෙතත් අප හැකි තරමින් ඒවා දුරීභූත කිරීමට ඉදිරිපත්වීම අපේ යුතුකමක්. පොලීසියට ඇඟිලි ගැසීම විශේෂයෙන් මැතිවරණ කාලයේදී බහුලව සිදු වන දෙයක්. කොළොන්නාව ආසනයේ අතුරු මැතිවරණයේදී සිදු වූ කරුණුවලින්ම ඒ බැව් හොඳ හැටි පැහැදිලි වෙනවා. ඒ අවධියේ පොලීසියේ නිලධාරීන්ට බලපෑම් රාශියක් තිබුණා. කොතරම් තිබුණාද කිව්වොත්, සමහර පොලිස් නිලධාරීන්, සමහර ඇමති කෙනකු විසින් තමන්ගේ බංගලාවට කැඳවා නීති විරෝධි කටයුතු කරන්නට පවා පොළඹවා තිබෙනවා. කෙසේ හෝ මේ මැතිවරණය දිනන්න ඕනෑය, එම නිසා මැරවර බලය ආදිය පාවිච්චි කිරීමට පොලීසියෙන් ආධාර දිය යුතුය කියා තිබෙනවා. ඒවාට අවනත නොවුණ උදවිය ඒ තනතුරුවලින් මාරු කර යවා, මීට කලින් ඔය විධියේ සැර පරුෂ ආකාරයට වැඩ කළ උදවිය මැතිවරණ කාලයේදී ඒ ප්‍රදේශයට ගෙන්වා තිබෙනවා. ඔබතුමා හෝ වෙනත් වග කිය යුතු කෙනකු හෝ මේ ගැන විභාගයක් පැවැත්තුවොත් ඒ නිලධාරීන් ඉදිරිපත් වී කියනවා ඇති මෙන්න මේ මේ අකටයුතුකම් සිදු වුණාය කියා.

මේ අදහස මා ඉදිරිපත් කරන්නේ පළි ගැනීමේ චේතනාවකින් නොවෙයි. මැතිවරණ කාලවලදී ඇති වන මෙවැනි ඇඟිලි ගැසීම් පොලීසිය කෙරෙහි බල පාන්නට වූ විට ඉතාම භයානක තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වන නිසයි.

මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමාට එක් අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි. මැතිවරණ කාලවලදී මැතිවරණ කටයුතුවල යෙදෙන නිලධාරීන් හැසිරවීම පිණිස, එක්තරා අංශයක් මැතිවරණ කොමසාරිස්තුමා අණ යටතේ පිහිටෙව්වොත් අප කාටත් එය විශාල ප්‍රයෝජනයක් වේවිය කියා මා කල්පනා කරනවා. එවිට එක්තරා ස්වාධිනත්වයකින් යුක්තව කටයුතු කරන නිසා මොන ආණ්ඩුවක් බලයේ සිටියත්, ඒ ආණ්ඩුවට හෝ පොලිස්පතිතුමාට හෝ එල්ලවන චෝදනාවලින් වළකින්නට පුළුවන්කමක් ලැබෙනවා. මෙය මැතිවරණ කාලයේදී මා අත් දුටු තත්ත්වයක් බව ප්‍රකාශ කරන්නට කැමතියි. මා හිතන්නේ අගමැතිතුමාත් ඒ පිළිබඳ විස්තර දන්නවා ඇති.

ඒ වාගේම සමහර ඡන්ද පෙත්සම්වලදී පොලිස් නිලධාරීන් ලවා අකටයුතු කිරීමට පොළඹවා තිබෙනවා. සමහර ස්ථානවලදී ප්‍රසිද්ධ නොකළ ඇතැම් කඩදාසි පවා පොලිසියේ ලිපිගොනුවලට ඇතුළත් කිරීමට බලපෑම් ඇති වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විභාගයක් පැවැත්වුවොත් ඒවා එළි වන්නට ඉඩ තිබෙනවා.

ලූනාව සිද්ධිය ගැන අද විශාල ආන්දෝලනයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන්, විශේෂයෙන් විත්තිකරුවන්ට ඇප දීම සඳහා ආණ්ඩු පක්ෂයේ සමහර උදවියගේ ඇඟිලිගැසීම් තිබෙන බව ගරු මන්ත්‍රීවරයකු විසින් ප්‍රකාශ කරනු ලැබුවා. ඒ පිළිබඳව මාත් තරමක් දුරට පරීක්ෂා කළා. ශ්‍රාවස්තියේ ටෙලිපෝන් රෙජිස්ටරය ගෙන, කොයි කොයි මන්ත්‍රීවරුන් කොයි කොයි තැන්වලට ටෙලිපෝන් කර තිබේ දැයි සොයා බැලුවොත් පෙනේවි, ආණ්ඩු පක්ෂයේ කීප දෙනකුම ඒ විත්තිකරුවන්ට ඇප දීමට හෝ ඔවුන් සම්බන්ධයෙන් වෙනත් කටයුතු කිරීමට හෝ ලූනාව තානායමටත්, ඒ වාගේම පොලීසියටත්, ටෙලිපෝන් කර තිබෙන බව.

මා ඊයේ මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා, ඇතැම් මන්ත්‍රීවරුන්ගේ නිවාසවලට යන එන උදවිය ගැනත්, ඔවුන් යන එන තැන් ගැනත් පරීක්ෂා කිරීමට චක්‍ර ලේඛයක් යවා තිබෙන බව. එම චක්‍ර ලේඛය යවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නේ ගරු අගමැතිතුමාගේ අණක් අනුවද, එහෙම නැත්නම් හදිසි නීතිය අනුවද, එසේත් නැත්නම් යම් පැමිණිල්ලක් අනුවදැයි මා දැනගන්නට කැමතියි. ඒ වාගේම මන්ත්‍රීවරුන් හැසිරිය යුතු ආකාරය සම්බන්ධයෙන් යම් ක්‍රියා පද්ධතියක් ඉදිරිපත් කිරීමට අගමැතිතුමා කැමතිදැයි මා දැනගන්නට සතුටුයි.

මෑත කාලයේ මේ රටේ රාජ්‍ය පෙරලීමේ කුමන්ත්‍රණ දෙකක් ගැන සඳහන් වී තිබෙනවා. එම කුමන්ත්‍රණ දෙක ඇති වුණේ 1962 දී සහ ඊට පසුවයි. මහජන ඡන්දයෙන් බලයට පත් වූ රජයක් බලහත්කාරයෙන් පෙරළා දැමීම අයුතු බව අප කවුරුත් අවිවාදයෙන් පිළිගන්නවා. වර්තමාන අගමැතිතුමා අප බලයේ සිටි කාලයේ කළ නොයෙක් ප්‍රකාශවලිනුත්, ඒ වාගේම මැතිවරණ ප්‍රකාශවලිනුත්, රටට පැහැදිලි කර දී තිබෙනවා, එවැනි කුමන්ත්‍රණ අනුමත නොකරන බව. අපත් ඒ අදහසට සම්පූර්ණයෙන්ම එකඟ වෙනවා. අප ගැන නොයෙකුත් අසත්‍ය ප්‍රචාර කෙරී තිබුණත්, අප පිළිබඳ වැරදි වාර්තා අගමැතිතුමාට ලැබී තිබුණත්, සර්වජන ඡන්ද බලය තිබෙන රටක මහජන ඡන්දයෙන් බලයට පත් වූ රජයක් මහජන ඡන්දයෙන්ම මිස වෙනත් අන්දමකින් පෙරළා දැමීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවියත්, ඒ වාගේම අප සමඟ අත්වැල් බැඳගෙන සිටින අනෙකුත් පක්ෂවල උදවියත්, අනුමත කරන්නේවත් එවැන්නක් සඳහා ඉදිරිපත් වන්නේවත් නැති බව මා ප්‍රකාශ කරන්න කැමතියි. එහෙත් ඡන්ද බලයෙන් ආණ්ඩු බලය ලබාගෙන තිබුණත්, ඒ රජය සර්වජන ඡන්ද බලය නැති කිරීමට ක්‍රියා කළොත්, ප්‍රජාතන්ත්‍ර විරෝධි ඒකාධිපති පාලනයක් ගෙන ගියොත්, එවැනි ඒකාධිපති රජයක අදහස් නිෂ්ප්‍රභ කරමින් එම රජය කඩාකප්පල් කර දමා, බලහත්කාරයෙන් හෝ ආණ්ඩු බලය ඇල්ලීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන අය කැටුව අප නිර්භීතව වැඩ කරන බවට, අගමැතිතුමා එදා තරවටු කළා වාගේම අපත් එතුමන්ලාට තරවටු කරන්නට කැමතියි. එවැනි තත්ත්වයක් ඇති නොවන බවටත්, නියමිත කාලයේ ප්‍රජාතන්ත්‍රවාදීව මහා මැතිවරණයක් පවත්වන බවටත් ගරු අගමැතිතුමා ප්‍රකාශයක් කිරීම ගැන අප සන්තෝෂ වෙනවා.

මේ ආණ්ඩුව ඒකාධිපති ක්‍රියා පිළිවෙතක් ගෙන යන බවට අප තුළ සැකයක් හා බියක් ඇති වුණේ, රාජ්‍ය ඇමතිතුමා කළ එක්තරා ප්‍රකාශයක් නිසයි. ඒ සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී විවේචනය කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. රාජ්‍ය ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්නට මා පොරොන්දු වුණා. ඒ පොරොන්දුව අනුව ඒ අවස්ථාවේදී කරුණු ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මා කලින් සඳහන් කළ කුමන්ත්‍රණ දෙකේ සැකකරුවන්ට දෙවිධියකට සලකන බවක් අපට පෙනෙනවා. මේ ආණ්ඩුව හෝ වේවා, අපේ ආණ්ඩුවක් හෝ වේවා, අප දෙගොල්ලටම විරුද්ධ ආණ්ඩුවක් හෝ වේවා, බලහත්කාරයෙන් පෙරළන්නට ඉදිරිපත් වන උදවියට එකම විධියකට දඬුවම් කිරීම, සංග්‍රහ කිරීම, සැලකිලි දැක්වීම තමා, නියම යුක්තිය. කුමන්ත්‍රණ සැකකරුවන්ගේ අර අභියාචනයට මේ ආණ්ඩුවෙන් දුන් පහසුකම් ගැන මේ අවස්ථාවේදී විවේචනය කරන්නට මා අදහස් කරන්නේ නැහැ. එහෙත් අපට පැහැදිලිවම පෙනී ගොස් තිබෙනවා, කුමන්ත්‍රණ දෙකේ සැකකරුවන්ට දෙවිධියකට සලකන බව. 1962 කුමන්ත්‍රණ සැකකරුවන්ට රජයට සම්බන්ධ නොයෙකුත් ආයතනවල හා සංස්ථාවල පදවි අද ලැබෙනවා. මා ඊට විරුද්ධ නැහැ. එසේම, කොයි හමුදාවට අයත් වුණත් ඒ අය හුඟ දෙනකුට සම්පූර්ණ වැටුප් ලැබෙනවා. එසේ ඔවුන්ට සම්පූර්ණ වැටුප් ලැබෙන අතර වෙනත් රක්ෂාවල යෙදෙන්නටත් ඔවුන්ට පුළුවන්කම ලැබී තිබෙනවා. දැනටමත් ඒ අයගෙන් සමහරුන් එසේ සංස්ථාවල රක්ෂාවල් කරනවා. ඒ අයගෙන් සමහරුන් වැරදිකරුවන් හැටියට උසාවියෙන් තීන්දු කළ අයයි.

1962 කුමන්ත්‍රණයට සහභාගි වුණ අයට එසේ සලකන අතර, ඊට පසුව ඇති වූ කුමන්ත්‍රණ සැකකරුවන්ට සලකන්නේ ඊට හාත්පසින්ම වෙනස් විධියකටයි. ඒ අයගෙන් සමහරකුගේ අද වැඩ තහනම් කර තිබෙනවා. ඔවුන්ට විරුද්ධව කිසිම චෝදනා පත්‍රයක් මෙතෙක් ඉදිරිපත් කර නැහැ; කිසිම විභාගයක් පවත්වා නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ඒ අය ඉන්නේ කොහේද යන්නේ කොහේද කියා කිසිවක් දන්නේ නැහැ. සමහර අය සම්පූර්ණ පඩි සහිතව නිවාඩු පිට සිටිනවා. රාජපක්ෂ කියන මහත්මයා 1962 කුමන්ත්‍රණයේදී පැමිණිලි පක්ෂයට නැත්නම් ආණ්ඩුවට පක්ෂව සාක්ෂි දුන් කෙනෙක්. ඒ නිසා ඔහු තවමත් වැඩට අරගෙන නැහැ. තවමත් ඔහුගේ වැඩ තහනම්. ඒ නිසා මේ දෙකොටසටම එක ආකාරයකට සංග්‍රහ කිරීමට පියවරක් ගන්නා ලෙස ගරු අගමැතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

1962 දී කරන්නට ගිය කුමන්ත්‍රණයත් බරපතළ අපරාධයක්. ඊට පසුව කුමන්ත්‍රණයක් කරන්නට ගියා යයි සැක කර සිටින අය කුමන්ත්‍රණයක් කරන්නට ගියාය කියා ඔප්පු වුණොත් ඔවුණුත් ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව කටයුතු කළ නිසා, 1962 සිද්ධිය බරපතළ අපරාධයක් වනවා මෙන්ම මෙයත් බරපතළ අපරාධයක් වෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ සිටියදී එවකට බලයේ සිටි ආණ්ඩුව පෙරළීමට සූදානම් වූ අයට තමුන්නාන්සේලා සංග්‍රහ කරනවා නම්, තනතුරු දෙනවා නම්, ආශිර්වාද දෙනවා නම්, එය කුමන්ත්‍රණ ක්‍රමයටම දෙන ධෛර්යයක්, ආධාරයක්. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරනවා නම් ඔය දෙකොටස සම්බන්ධව ක්‍රියා කළ යුත්තේ එක් ආකාරයකටයි. ඒ නිසා 1962 කුමන්ත්‍රණයට අසු වූ අයට සංග්‍රහ කරන ආකාරයටම අනික් කොටසටත් සංග්‍රහ කරන්නය කියා මා කියනවා. යම් කොටසකගේ වැඩ තහනම් කර සිටිනවා නම් ඔවුන්ට විරුද්ධව ඇති චෝදනා ඉක්මනින් විභාග කර ඔවුන් වැරදිකරුවන් නම් දඬුවම් දෙන්න; නැත්නම් නිදහස් කරන්න. යම් කොටසක් නිවාඩු යවා සිටිනවා නම් ඔවුන්ටත් අනික් කොටසට වගේම කුමක් හෝ රක්ෂාවක් කරන්නට ඕලය දෙන්න. රක්ෂාවක් නැතිව නිකම් ගෙවලට වී සිටීම නිසා මිනිසුන් කොතරම් අමාරුවකට පත් වෙනවාද කියා අප දන්නවා.

ගරු සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයේ අප ජාතිවාදයට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ආගම් භේදවාදයටත් සම්පූර්ණයෙන්ම විරුද්ධයි. අප කියා සිටින්නේ වැඩි කණ්ඩායමේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම සුළු කණ්ඩායම්වලටත් සාධාරණ තැන දිය යුතුය කියලයි. සාමාන්‍ය ජීවිතයේ හා සමාජයට මෙන්ම රජයේ සේවකයින්ටත් හමුදාවල අයටත් ඒ අයිතිවාසිකම දිය යුතුයි. රක්ෂාවලට බඳවා ගැනීමේදී හා උසස් කිරීමේදී අභවල් ආගම අදහන අයට විශේෂ තැනක් දිය යුතුයි අභවල් ආගම අදහන අයට සාමාන්‍ය තැනක් දිය යුතුයි, කියා විශේෂයක් කිරීම සම්පූර්ණයෙන්ම වැරදියි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට පැමිණියාට පසුව බෞද්ධ සමිති සංහාරයක් පැවතුණාය කියන එක ප්‍රචාරය වී තිබෙනවා. හමුදාවල උදවිය බෞද්ධ සමිතිවලට බැඳී සිටියා නම් ඒ අය ගැන වග විභාග කර ඇතැම්විට ඒ සමිති විසුරුවා හරින්නට පවා කටයුතු කළ බව ප්‍රචාරය වී තිබෙන කරුණක්. එමෙන්ම පත්වීම් උසස්වීම් ආදිය දීමේදී ආගම් ගැන සලකා බලා ඒ ඒ පදවි හා උසස්වීම් දෙන බව හමුදාවේ මෙන්ම රටපුරා පැතිර පවතින කථාවක්. අබෞද්ධ අසිංහල අයට ලොකු තැන් දෙන අතරම බෞද්ධ සිංහල අයට අර සුදුසුකම් තිබුණත් ඒ පදවි දෙන්නේ නැත කියන එක මීට පෙර සමහර පත්තර මගින් සාධක සහිතව ඔප්පු කළා. ආගම් භේදවාදයක් හෝ ජාති භේදවාදයක් ඇතිකළ යුතුයි කියා මෙයින් අප අදහස් නොකරන බව නැවතත් කියන්නට ඕනෑ. එහෙත් සුදුසුකම් තිබෙනවා නම් කුමන ආගමක කෙනෙක් වුවත්, කුමන ජාතියක කෙනෙක් වුවත්, ඒ සුදුසුකම් අනුව තනතුරු දෙනවා මිස ආගම්භේදය හෝ ජාතිභේදය ගැන සලකා කටයුතු කිරීමට විරුද්ධවයි අප කථා කරන්නේ.

ගරු සභාපතිතුමනි, ඉන්දු-ලංකා ගිවිසුම සම්බන්ධවත් වචනයක් දෙකක් කිව යුතුව තිබෙනවා. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කීවාක් මෙන් මේ සම්බන්ධව විදේශ විනිමය වශයෙන් කිසිම මුදලක් අයවැය ලේඛනයෙන් වෙන් කර නැහැ. එක තැනක පමණක් "ඉන්ඩියුස්මන්ට්" වශයෙන් රුපියල් 3,555 ක්ද කොහෙද වෙන් කර තිබුණා. එය, මේ රටින් පිට වීමට ඉන්දියානුන් ධෛර්යමත් කිරීම සඳහා මිස ගරු අගමැතිතුමා බලාපොරොත්තු වන අන්දමට ඉන්දු ලංකා පනත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රියාත්මක කිරීමට වෙන් කළ මුදලක් නොවෙයි. එම නිසා මේ සම්බන්ධයෙන් කුමන විධියේ පියවරක් ගන්නට එතුමා අදහස් කර තිබෙනවාදැයි අප දැන ගන්නට කැමතියි. පණත ක්‍රියාවේ යෙදීමට දෙපාර්තමේන්තුවක් සකස් කර තිබෙනවා මිස ඉන්දියානුවන් යැවීමට වුවමනා කරන විදේශ විනිමය වෙන් කර නැති නිසා පණත ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න පිළිබඳව රටට ඇසෙන සේ ප්‍රකාශයක් කිරීම ගරු අගමැතිතුමාගේ යුතුකමක්. ඉන්දියානුවන් 1,50,000 දෙනාගේ ප්‍රශ්නයත් අවුරුද්දක් ඇතුළත විසඳන බවට පොරොන්දුවක්, සිරිමා ශාස්ත්‍රී ගිවිසුම ඇති කරන අවස්ථාවේදී එවකට සිටි අගමැතිණියත් ශාස්ත්‍රී අගමැතිතුමාත් ඇති කර ගත්තා. එම සාකච්ඡාවේදී ශාස්ත්‍රී අගමැතිතුමා එක්තරා ප්‍රකාශයක් කළා. යම් දවසකදී අපේ වර්තමාන අගමැතිතුමාටත් ඒ ප්‍රකාශය ප්‍රයෝජනවත් වන්නට පුළුවන් නිසා මා එය මතක් කරන්නට කැමතියි. "අගමැති නේරුතුමා තරම් ලොකු කෙනකු වශයෙන් මා නොපිළිගැනුනත් මගේ මිත්‍රයින් මගේ අදහස්වලට පොළඹවා ගන්නට මට පුළුවන්කම තිබෙනවා" යි එදා ශාස්ත්‍රී අගමැතිතුමා කිව්වා. "එම නිසා එකී අමතර ඉන්දියානුවන් 1,50,000 ම වුවත් ඉන්දියාවට ගන්නට මට පුළුවන් වේය" යි ද එතුමා වැඩි දුරටත් කිව්වා. එම නිසා නැවතත් දෙරටේ අගමැතිවරුන් සාකච්ඡා කොට මේ පිළිබඳව ස්ථිර පියවරක් ගැනීමට ගරු අගමැතිතුමා අදහස් කරනවාද යන වග අප දැන ගන්න කැමතියි.

පූ. භා. 11

සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ඇති කොට දැන් අවුරුදු 3 කටත් වැඩි කාලයක් පසු වුණා. පණත සම්මත වීත් දැන් සෑහෙන කාල සීමාවක් ඉක්ම ගොස් තිබෙනවා. ඒ අතරතුර රටේ නොයෙක් ප්‍රශ්නත් උග්‍ර වේගෙන යනවා. එම නිසා, මා ගරු අගමැතිතුමාගෙන් අහන්නේ, මේ ඉන්දියානුවන් 1,50,000 හේ ප්‍රශ්නය විසඳීම සඳහා දැනට මොන විධියේ පියවරක් ගෙන තිබෙනවාද, ඉදිරියට කුමන විධියේ පියවරක් ගන්නට අදහස් කරනවාද යන ප්‍රශ්නයයි. ඉන්දු ලංකා පණත ගැන කථා කරන විට අපේ පත්කළ ගරු මන්ත්‍රී තොණ්ඩමන් මහත්මයා මස්කෙළියේදී කර තිබුණු ප්‍රකාශයක් මට මතක් වෙනවා. ඉන්දියානු පණතට විරුද්ධව ඡන්දය දුන් අයට දොස් කියමින් එතුමා, සිරිමා ශාස්ත්‍රී ගිවිසුමට පක්ෂ අය ඉන්දු ලංකා පණතට විරුද්ධ වන්නේ මොන හේතුවක් නිසාදැයි ප්‍රශ්න කර තිබුණා. ඒ කාරණය තේරුම් බේරුම් කර ගන්නට එතුමාට බැරි බවත් කියා තිබුණා. එහෙම නම්, ඉන්දු ලංකා පණතට පක්ෂ අය සිරිමා ශාස්ත්‍රී ගිවිසුමට විරුද්ධ වුණේ ඇයිදැයි මා තමුන්නාන්සේගේ මාර්ගයෙන්—එසේ නැත්නම් කෙළින්ම—එතුමාගෙන් අහනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

We have discussed the Indo-Ceylon Bill at length. Will the hon. Member try to wind up soon because there are another eleven Members who wish to speak

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ඒ සම්බන්ධයෙන් මා මීට වැඩි කාලයක් ගන්නේ නැහැ. විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධව ඊළඟට වචන ස්වල්පයක් කියන්නට ඕනෑ. විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කටුගම්පොල ගරු මන්ත්‍රීතුමා (ටී. බී. සුබසිංහ මයා.) විස්තරාත්මක කථාවක් කළ නමුත් මාද ඒ ගැන වචන දෙකතුනක් කියන්නට අදහස් කරනවා. ගරු අගමැතිතුමාට මේ අවස්ථාවේදී බැහැරට යන්නට සිදුවීම ගැන මා කණගාටු වෙනවා. කවර රටකට වුවත් විදේශ ප්‍රතිපත්තිය ඉතා වැදගත් එකක් බවත්, විශෙෂයෙන් අලුත නිදහස ලැබූ රටවල අභ්‍යන්තර හා ජාත්‍යන්තර කටයුතුවලදී එය ඉතා වැදගත් තැනක් ගන්නා බවත් අප කවුරුනුත් දන්නා කරුණක්. 1947 දී අපට එක්තරා අන්දමක දේශපාලන නිදහසක් ලැබුණත් සර්ව සම්පූර්ණ නිදහස කරා ගමන් කරන්ට 1956 දක්වා අපට බැරිව තිබුණා. නිදහස කියන්නෙ දේශපාලන නිදහසට පමණක් නොවෙයි. දේශපාලන මෙන්ම ආර්ථික, සංස්කෘතික සහ සමාජයීය නිදහස ඊට ඇතුළත් වන බවයි, අපගේ වැටහීම. දේශපාලන නිදහස ලැබුණත් හරියාකාර විදේශ ප්‍රතිපත්තියක් සකස් කර ගන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

බැරි වූ නිසා 1947 සිට 1956 දක්වා සාමාන්‍ය යෙන් අපි යටත් විජිතවාදී විධියටයි හැසු රුණේ. කොයි එකටත් අධිරාජ්‍යවාදී ස්වාමි වරුන්ගෙන් අපට අවසර ගන්ට සිදු වුණා. වෙනෙකක් තබා 1956 ට පෙර සූයස් ග්‍රහණ ය බැලීමට රුසියන් විද්‍යාඥයින්ට මේ රටට එන්නටත් තහනමක් තිබුණු බව තමුන් නාන්සේ දන්නව. එමෙන්ම චෙකොස් ලෝවේකියානු පාපන්දු කණ්ඩායමකටත් මේ රටට පැමිනීම තහනම් කළා. විශේෂ යෙන්ම සමාජවාදී රටවල උදවියට මේ රටට එන්ට බැරිකමක් තිබුණා. ඒ තත් වය වෙනස් කරල මධ්‍යස්ථ රටක් හැටියට හැම රටක් සමගම මිත්‍රත්වයෙන් අත්වැල් බැදගෙන සිටීම අපි ප්‍රතිපත්තියක් කර ගත්තා. එහි ප්‍රතිඵල මහා ජලගැල්ම අවස් ථාවේදී අපට හොඳහැටි ඔප්පු වුණා. අප අමාරුවට පත්වුණු ඒ අවස්ථාවේදී අපට හැම රටක්ම වගේ ආධාර දුන්න.

1956 න් පසුව විදේශ ප්‍රශ්නවලදීත් ලංකාව විශාල තැනක් ලබාගෙන ජාත්‍යන් තර කීර්තියට පවා ලක් වුණා. අද මධ්‍යස්ථ රටවල් එකතුව මැද පෙරදිග තත්ත්වය ගැන සාකච්ඡා කරනවා. මීට පෙර මෙවැනි අවස්ථා ඇතිවුණු අවස්ථාවල ලංකාව පෙරමුණ ගත් බව තමුන්නාන්සේ දන් නවා. විශේෂයෙන් සූවස් ප්‍රශ්නයේදීත්, අනිකුත් අප්‍රිකානු ප්‍රශ්නවලදීත්, චීන-ඉන්දියා අරගලය අවස්ථාවේදීත් මධ්‍යස්ථ රටවල් එකතුව පවත්වන ලද සම්මේලන වලට ලංකාව සහභාගි වුණා පමණක් නොව සම්මේලන ලංකාවේත් ඇති කර විශේෂ තැනක් ගෙන කටයුතු කළ බව ඔබතුමාට මතක ඇති. අද මොකද වෙලා තිබෙන්නෙ? කවුරුත් සමග මිත්‍රත්ව යෙන් සිටිනවා යයි මේ ආණ්ඩුව කොයි තරම් කිව්වත් ආර්ථික ප්‍රශ්න හා දේශ පාලන ප්‍රශ්න සම්බන්ධයෙන් ලෝක බැංකුවේත්, ජාත්‍යන්තර ණය මණ්ඩල යේත්, අධිරාජ්‍යවාදී ස්වාමිවරුන්ගේත් අවවාද අනුව කටයුතු කරන බව පැහැදිලි යි. ඒ වගේම අපේ අගමැතිතුමා ස්වාධීන රටක නායකයෙකු විධියට වැඩ කරනව නම්, මීට පෙර සිටි අගමැතිනිය වගේ මධ්‍යස්ථ රටවල සාකච්ඡාවට සහභාගි නො වන්නෙ ඇයි? අපි මේවා විවේචනය කරන විට අපට දොස් පවරනවා. එහෙත් මේ සාධක තිබෙන නිසා ආණ්ඩුව පැත්තේ සිටින ගරු මන්ත්‍රීවරුන්ටත් තම ඡන්ද දායකයින්ට හරිහැටි පිළිතුරු දෙන්ට බැරි තත්ත්වයක් උද්ගතව තිබෙනවා. අපේ රට ස්වාධීන රටක් නම්, අපි හැම රටක් සමගම මිත්‍රත්වයෙන් සිටිනවා නම්, මිසරය වැනි අපේ මිත්‍ර රටකට පහර වදින අවස්ථා වේදී මධ්‍යස්ථ රටවල් විසින් පවත්වන්ට යෙදුණු සාකච්ඡාවට අපේ අගමැතිතුමාට සහභාගි වෙන්ට බැරි ඇයි? මේ රජය කට යුතු කරන්නෙ මධ්‍යස්ථ රටක් වශයෙන් නොව සම්පූර්ණයෙන්ම ඇමෙරිකාවටත් අධිරාජ්‍යවාදී ක්‍රමයටත් හිස නමන රටක් හැටියට යි. මහජනයාත්, අපිත් මේ ආණ්ඩුවට චෝදනා කරන්නේ ඒ නිසයි. විශේෂයෙන්ම මේ තත්ත්වය වෙළඳ ප්‍රශ්නවලට හුඟක් දුරට බලපානවා. ඒ සම්බන්ධයෙන් මා පසුව විස්තර කරන්ට අදහස් කරනවා. මේ අන්දමට බටහිර රට වලටත්, අධිරාජ්‍යවාදී රටවලටත් ගැතිව කටයුතු කරන නිසා අපේ ආර්ථික ප්‍රශ්න අවුලෙන්-අවුලට පත්ව තිබෙනව; අපේ වෙළඳ ගිවිසුම් කඩාකප්පල් වෙලා තිබෙ නවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට චීනයත් සමග පැන නැගී තිබෙන ප්‍රශ්නය සම් බන්ධයෙන් වචනයක් කියන්ට කැමතියි.

අද "ඩේලි නිව්ස්" පත්‍රයේ පළ කර තිබෙන පුවතක් ගැනත් කතු වැකිය ගැනත් මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරනවා.

"SECRET MEETING HERE NOW UNDER SCRUTINY

Political circles were yesterday speculating on the possibility of a link between a recent meeting attended by Chinese operatives and a former Coalition Minister, and the recent anti-Ceylon outbursts by the Chinese.

The 'Daily News' reliably understands that this aspect of the recent episode is being carefully examined.

Political sources indicated that this ex-Minister was earlier connected with Ceylon's trade policies."

මේ කියන හිටපු ඇමතිවරයාට තිබෙන සුදුසුකම් හැම එකක්ම මටත් තිබෙනවා. එමනිසා මට මේ කාරණය ගැන වචන දෙක තුනක් කථා කරන්නට තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට මේ පත්‍රයේම කතු වැකිය දෙස බලමු. කතු වැකියත් මුල් පිටුවේ ලොකු අකුරින් පළ කර තිබෙන ප්‍රවෘත්තියට අදාළ වන විධියටයි ලියා තිබෙන්නෙ. [බාධා කිරීමක්]

"BREAKING THE CHINESE GRIP

Our news columns report today the speculation in political circles that the Chinese Embassy's note resulted directly from a hush-hush confabulation between a former Minister and representatives of the Chinese Embassy. This line of reasoning points out that with more by-elections in the offing, and the General Elections themselves a half-term of office away, curtailing rice supplies to Ceylon would impose upon our people a major food crisis to which the National Government would obviously have no immediate answer."

සභාග රජයේ හිටපු ඇමතිවරයකු, වෙළඳාමට සම්බන්ධ හිටපු ඇමතිවරයකු චීන තානාපති කාර්යාලයේ උදවිය සමග රහස් සාකච්ඡාවක් කළාය කියා මුල් පිටුවේ පළ කර තිබෙන ප්‍රවෘත්තියෙන් කියනවා. ඊළඟට, කතු වැකියෙන් කියනවා, ඒ රහස් සාකච්ඡාවෙන් නිගමනයකට බසින්නට ඇත්තේ මේ අතුරු මැතිවරණ එහෙම ළඟ එන නිසාත් තව අවුරුදු දෙක හමාරකින් මහා මැතිවරණයක් පවත්වන්නට තිබෙන නිසාත් තමුන්නාන්සේලා අමාරුවේ දමන්නට හාල් ගෙන්වීමට නොහැකි වන ආකාරයට පියවරක් ගැනීමටය කියා. මේ අවස්ථාවේදී මා ගරු අගමැතිතුමාගෙන් එක් ඉල්ලීමක් කරනවා. ඉරාකය සම්බන්ධව තිබුණු ලිපියක් ගැන තමුන්නාන්සේට මතක ඇති. අපට පාඩුවන විධියට, අපේ මිත්‍ර රටකට පහර වදින විධියට එක්තරා පුවතක් පළ කර තිබුණා. ඒ අවස්ථාවේදී තමුන්නාන්සේ ඉරාක තානාපතිට කියා සිටියා එය නිවැරදි කරන්නටය කියා. ඒ ක්‍රියා මාර්ගය හරියට හරි. අප බලයේ සිටින කාලයේදීත් මේ පත්‍ර අපේ මිත්‍ර රටවල් සම්බන්ධව මේ අන්දමට නොයෙකුත් ප්‍රවෘත්ති පළ කළා. කෙළවරක් නැතිව එවැනි ප්‍රවෘත්ති පළ කළා. දැනුත් ඒ විධියටම ක්‍රියා කරගෙන යනවා. තමුන්නාන්සේලා මෙන් හදිසි නීතිය දමා පත්‍රවලට ඉබ්බෝ දමන්නට අප කල්පනා කළේ නැහැ. එහෙත් දැන් අප පාඩමක් ඉගෙන ගෙන තිබෙනවා.

ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)

(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

ඒ කාලෙත් හදිසි නීති තිබුණා.

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

එහෙත් අප ප්‍රජාතන්ත්‍රවාදි විධියටයි වැඩ කළේ. ප්‍රජාතන්ත්‍රවාදය මේ තරම් දුරට ඒකාධිපති තත්ත්වයකට පත් කරන්නට පුළුවන්ය කියා අප සිතුවෙ නැහැ. එහෙත් 1970 දී තමුන්නාන්සේලා මැතිවරණයක් පවත්වනවා නම්, ඒ මැතිවරණයෙන් අප බලයට පත් වුණත් මේ විධියට අප හදිසි නීති පාවිච්චි කරන්නේ නැහැ. මීට වඩා ප්‍රජාතන්ත්‍රවාදී විධියටයි අප හදිසි නීති වුවත් පාවිච්චි කරන්නෙ.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

අපටත් දන්වන්න ඒ විධිය.

පූ. භා. 11.15

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

ඒ නිසා මේ වගේ දේ පළ කිරීමේදී කරුණු හොඳින් සොයා බැලිය යුතු බව මා මතක් කරන්නට කැමතියි. මා වගේ කෙනකුගේ නමත් මෙයට සම්බන්ධ වී තිබෙන නිසා ඇති වූ සිද්ධිය කුමක්ද යන්න මා විස්තර කරන්නට සතුටුයි.

ගරු සභාපතිතුමනි, අප නොයෙක් විධියේ තානාපතිවරුන් සමග, තානාපති කාර්යාලවල නිලධාරීන් සමග ආශ්‍රය කරන උදවිය. ආණ්ඩු පක්ෂයේ අයත් එහෙමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
අපත් එහෙමයි. ඒ තානාපතිවරුන් හෝ තානාපති කාර්යාලවල නිලධාරීන් හෝ හමු වීම ගැන අපට කිසි තහනමක් නැහැ. ඒ අයගේ සම්භාෂණවලට අපත් යනවා; තමුන්නාන්සේලත් යනවා. අපට අවසථා වක් තියෙනවා නම් සමහරවිට අපත් ඒ අයව කැඳවනවා. කෙසේ වෙතත් මේක නම් සම්පූර්ණ අසත්‍යයක්. එහෙත් මේකේ පොඩි ඇත්තක් තියෙනවා. ඇත්ත මේකයි.

මා හිතන පිළිවෙළට මේ වාර්තාව මෙහෙ ලිවූ එකක් නොවෙයි. මෙවැනි වැදගත් ලිය විල්ලක් මා හිතන පිළිවෙළට එහෙන් සූද නම් කර එවීමයි, සිදු වන්නේ. මේ ලිය විල්ල පළ වුණාට පසු මට ටෙලිෆෝන් කර ඇසුවා මාව හමු වන්නට පුළුවන්ද කියා. එදා 16 වැනිදා දවල් 1 ට මා නුවර යන්නටයි සූදානම්ව සිටියේ, පෙරහරත් බලාගෙන, තමුන්නාන්සේලාගේ ඩී. එස්. සේනානායක සමරුව පිළිබඳ ප්‍රදර්ශනයත් බලාගෙන එන්න. මගෙන් ටෙලිෆෝන් කර ඇසුවාම මා කීවා, මා 1 ට යනවා, පුළු වන් නම් ඊට කලින් එන්නය කියා. 12.45 ට පමණ ආවා. ඇවිත් පත්‍රයට දී තිබුණු ලියවිල්ලේ පිටපතක් මට පෙන් නුවා. මෙය පැහැදිළිව පෙන්වන්නටයි ආවේ, කරුණාකර විපක්ෂයේ අනික් නායකයන්ටත් මේ බව කියන්නය කියා මට කිව්වා. වෙච්ච සිද්ධිය ඒකයි. තමුන් නාන්සේලාට හාල් නොලැබුණත් අප ටත් මාස භාගයක් පමණ නිරාහාරව සිටින් නටයි, සිදු වන්නේ.

මේ විධියට පත්‍ර අපව කොයි තරම් නරක අන්දමට—කළු විධියට—තාර ගා ඉදිරිපත් කර තිබෙනවද කියා තමුන් නාන්සේ දන්නවා. ඒක ගරු අගමැති තුමාට නවත්වන්නට බැහැ. අපේ ආණ්ඩුව තියෙන කාලයේදීත් ඒක සිදු වුණා. විශේෂයෙන් මහ මැතිවරණය දා මගේ ඡායා රූපය විකට චිත්‍ර මගින් නොයෙක් විධියට—දූෂණ රූප විධියට—පළ කළා. එසේ කළාට කමක් නැහැ. එහෙත් මේ අන්දමට ජාත්‍යන්තර සම්බන්ධකම් පිළි බඳව අපේ නම් ඇද මඩ ගැසීම ප්‍රවෘත්ති පත්‍ර ව්‍යාපාරයටම කැළලක්. අපට ඒවා විඳ ගන්නට පුළුවන්. අපට ඒවාට මුහුණ පාන්නට පුළුවන්. ඔය විධියේ චෝදනා වලටත්, පත්‍ර පළ කරන අපවිත්‍ර, කැත ප්‍රකාශණවලටත් මුහුණ පාන්නට ආත්ම ශක්තියක් අපට තිබෙනවා. ඒ නිසා තමයි, අදත් අපට ඔළුව උස්සාගෙන සිටින් නට පුළුවන් වී තිබෙන්නේ. මා අවුරුදු 19 ක් තිස්සේ දේශපාලනයෙහි යෙදී සිටි නවා. අවුරුදු 9 ක් මා ආණ්ඩුවක සිටියා. අදත් අපට හෘදය සාක්ෂියට අනුව හිස ඔස වාගෙන කෙළින් බලාගෙන පාරේ යන්නට පුළුවන්. අපේ නැති බැරිකම් තියෙන්නට පුළුවන්. ඒක වෙනම දෙයක්.

ගරු සභාපතිතුමනි, චීන නැවේ ඇති වූ සිද්ධීන් මොනවාද කියා අප දන්නේ නැහැ. ඒ සම්බන්ධව යමක් කියන්නට අපට පුළුවන්කමක් නැහැ. කෙසේ වෙතත් නැව්වලට යන අය කව්ද කියා සොයා බැලීම ඒ සංසථාවේ යුතුකමක්. තමුන්නාන්සේලා මේ සිද්ධියේදී කරුණු සොයා බලා වාර්තා ලබාගෙන වැදගත් විධියට ප්‍රකාශයක් කළා. ජාත්‍යන්තර ප්‍රශ්නවලදී ක්‍රියා කළ යුත්තේ ඒ විධියටයි. එහෙත් මීට පෙර අබේගුණසේකර මහත්මයා ජාත්‍යන්තර සම්බන්ධකම්වලට සම්පූර්ණයෙන්ම පහර වදින විධියට නොයෙක් ප්‍රකාශ කරලා තියෙනවා. ජාත්‍යන්තර සම්බන්ධකම්වලට පහර වදින අයුරින් එසේ කථා කිරීම සුදු සුය කියා මා සිතන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මා එක ප්‍රශ්නයක් මේ අවස්ථාවේදී අහන්නට සතුටුයි. අප දන්නා හැටියට තිබෙන්නේ එක චීනයක් පමණයි; නව චීනය පමණයි. එය පිළි ගෙන තිබෙනවා. නමුත් දැන් චියාං කායි ෂෙක්ට තැනක් දීමට මේ ආණ්ඩුව කට යුතු කරනවාය කියා අපට ආරංචියක් ලැබී තිබෙනවා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
සම්පූර්ණයෙන් අසත්‍යයක්.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
එය අසත්‍යය කියනවා නම් බොහොම සන්තෝෂයි. ඒ සමගම මා ගරු අගමැති තුමාගෙන් ඉල්ලා සිටිනවා, එහෙම නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චියාං කායි ෂෙක්ගේ රේපස්මෝසාවට නැති නම් තායිවානයට අයත් උදව්ය ලංකාවේ නොයෙකුත් සම්මේලනවලට ගෙන්වීමත් නවත්වන්නටය කියා. නමුත් නාන්සෙ දන්නවා, දැනට ලංකාවේ බාලදක්ෂ කාන්තා සම්මේලනයක් පැවැත්වෙන බව. මෙම කාන්තා සම්මේලනයට සහභාගි වීම පිණිස තායිවානයෙන් නියෝජිතවරියන් කණ්ඩායමක් පැමිණ සිටිනවා, චියාං කායි ෂෙක්ගේ ආශිර්වාදයත් ඇතිව. ඒ ගැන සොයා බලන ලෙස ගරු අගමැතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම 1967 දෙසැම්බර මාසයේදී, බොක්ෂිං තරගයක් ලංකාවෙ පවත්වන්නට යනවා. එම තර ඟය, ඇමතිවරයාගෙ සංවිධානත්වය යටතේ පවත්වන්නක්. එය සංවිධානය කරන්නෙ කොයි ආකාරයෙන්ද කියා සොයා බැලීම පිණිස කොමිටියක් පත් කර ළඟදි සාකච්ඡාවක්ද පැවැත්වුවා. චියාං කායි ෂෙක්ගේ චරපුරුෂයෙක්ද ලංකාවට ගෙන්වා එම කොමිටියට සහභාගි කරවා ගත්තා. ඒ වාගේම පරමාණු බලය සහ වී සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වාගෙන යන සම්මේලනයට චියාං කායි ෂෙක්ගේ මිනිසුන්ටත් ආරාධනා කර තිබෙනවා. ඒ හැරෙන්නට තායිවානයට මෙහෙන් පිරි සක් යනවාය කියන ආරංචියක් ලැබී තිබෙ නවා. එපමණක් නොවෙයි, ඇමතිවරයකු ගෙ පුතෙක්ද ළඟදි තායිවානයට ගිහින් තිබෙනවා. නරක කාර්යයකට ගියාය කියා මා කියන්නෙ නැහැ. නමුත් මා අහන්නෙ කොහොමද මේ අය යන්නෙ, කව්ද වීසා බලපත්‍ර දෙන්නෙ කියායි.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
කව්ද ගියේ ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
මා නම සඳහන් කරන්න කැමති නැහැ. පෞද්ගලික වශයෙන් එක් එක් අයගෙ නම්, මේ ගරු සභාවෙදි සඳහන් කරන්න මා අදහස් කරන්නෙ නැහැ. මට ලැබී ඇති ආරංචියෙ හැටියට—

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
නම කියන්න.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
රජයෙ වැඩ ඇමතිතුමාගෙ පුතෙක්.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
ඇමතිතුමාට පුතෙක් නැහැ නෙ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
එහෙම නැතිනම් ඇමතිතුමාගෙ කව්රුන් හරි නෑයෙක්.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
එහෙම මා ප්‍රශ්න කළේ ගරු මන්ත්‍රී තුමාට වැරදි අවබෝධයක් ඇති වී තිබෙන නිසයි. ඒ ගරු ඇමතිතුමාට පුතෙක් නැහැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
එහෙනම් පුතෙක් නැති බව මා පිළිගන් නවා. නමුත් එතුමාගෙ ඥාතිවරයකු හෝ ගිය බව මට ආරංචියි. කවුරුන් හරි ගියා නම් එය සොයා බලන්න. කොළේ වහලා ගහන්න වුවමනා කරන්නෙ නැහැ. වචන යක් අල්ලා ගෙන එමගින් තර්කය බිඳීම නොවෙයි අවංක විධියට තර්ක කරන්නන් ගේ යුතුකම. පුතෙක් නැතිනම්, දුවෙක්ද එහෙමත් නැතිනම් වෙනත් කෙනෙකුද කියා සොයා බලන්න යුතුකමක් තිබෙ නවා. මට ලැබුණු ආරංචිය තමයි මා කීවේ. එපමණක් නොවෙයි, වීසා බලපත්‍රවලට සීල් ගහන්නෙත් නැතිලු ; වෙනත් පත්‍රිකාවක්, බලපත්‍රය වශයෙන් යොදා ගන්නෙ. ඒ අතරම එහෙන් මෙහාට නියෝජිතයින් එන්නෙ කොහොමද, ඒ අයට බලපත්‍ර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
දෙන්නෙ කොහොමද කියා සොයා බැලීමත් අගමැතිතුමාගෙ යුතුකමක්. එමනිසා, මෙය සිනහ වී ඉවත දැමිය යුතු කාරණයක් නොවෙයි, මෙය ජාත්‍යන්තර ප්‍රශ්නයක්. චියාං කායි ෂෙක්ට තැන දෙනවා නම් නව චීනයත් සමග ඇති වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නෙ කොහොමද ?

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

ගරු අගමැතිතුමා කියනවා නොවෙද, ඉඩ දෙන්නෙ නැතැයි කියා. එහෙමනම් එය පිළිගන්න ඕනැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

අගමැතිතුමාගෙ ප්‍රකාශයන් අප පිළිගන්නවා. නමුත් මෙවැනි දේවල් කරන විට අප තුළ සැකයක් ඇති වෙනවා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

ඒවා ගැන මා ඔක්කොම කියන්නම්.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

චියාං කායි ෂෙක් ගෙ චීනය පිළිගන්නෙ නැතැයි කියන කීම අප පිළිගන්නවා. නමුත් මේවා කරනවා නම් පිළිගැනීමේ වෙනසක් සිදු වී තිබෙනවාද ? එරටින් ඇවිත් චරපුරුෂ සේවාවල යෙදෙන්න ඉඩ තිබෙනවා නම්, නොයෙකුත් සම්මේලන වලට සහභාගි වෙන්න ඉඩ තිබෙනවා නම් පිළිගන්නෙ නැතැයි කීවත් පිළිගැනීමෙහි වෙනසක් සිදු වී තිබෙනවාද ? නිකම් කොලයට පමණක් නොවෙද මේ සියල්ල සීමා වී තිබෙන්නෙ ? එමනිසා අප අගමැතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටින්නෙ මොන ආණ්ඩුව ආවත් දැනට ඒ රටවල සමග පවතින මිත්‍ර සම්බන්ධකම් නැති නොවන විධියට ක්‍රියා කරන ලෙසටයි. ඇමෙරිකාව චක්ගෝලයකු වශයෙන් පිළිගන්නා, චීනයට ද්‍රෝහිකම් කරන, චියාං කායි ෂෙක් ගේ නියෝජිතයින් මෙහාට කැඳවා සම්මේලනවලට සහභාගි කරවා ගන්නවා නම් ඒ රටවල් සමග හොඳහිත පවත්වා ගන්නේ කොහොමද ? ජිනිවාහි සම්මේලනවලට ගිය අවස්ථාවලදී අපට පෙනී ගියා, චියා කායි ෂෙක්ගේ නියෝජිතයින් දායක මුදල් නොගෙව්වොත් එම දායක මුදල් ගෙවන්නෙ ඇමෙරිකාවෙන් බව. චියා කායි ෂෙක් ඇමෙරිකාවෙ චක්ගෝලයෙක් වූවාට අපත් ඇමෙරිකාවෙ චක්ගෝලයන් වාගේ වැඩ කරන්න වුව මනා කරනවාද ? ඇයි අප එවැනි චක්ගෝලයන්ට තැන දෙන්න යන්නෙ ? ගරු සභාපතිතුමනි, මධ්‍යස්ථ රටවල් එකතු වී ලෝක සාමය ගැන සම්මේලන පවත්වා ගෙන යනවා. ඇයි තමුන්නාන්සේලා එවැනි සම්මේලනවලට සහභාගි නොවන්නෙ ? ඇයි අප රටට ජාත්‍යන්තර වශයෙන් තැනක් ලැබෙන අන්දමට කටයුතු නොකරන්නෙ. ඇයි අපේ රටේ තත්ත්වය කෙළසන්න හදන්නෙ ? ගරු අගමැතිණිය සිටින කාලයේදී එවැනි හැම සම්මේලනය කටම ගොස් සහභාගි වුණා. තමුන්නාන්සේලා ස්වාධීන නම්, අපේ රට ස්වාධීන යයි පිළිගන්නවා නම් ටිටෝ, නසර්, ඉන්දිරා ගාන්ධි ආදීන්ගේ තාලයට තමුන්නාන්සේලාට යන්න බැරි ඇයි ? අප මධ්‍යස්ථ රටක් නම්, අපේ රටෙහි මධ්‍යස්ථභාවය ආරක්ෂා කර ගන්නා හැටියට ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! As the hon. Third Member for Colombo Central (Mr. Keuneman) is ill and wishes to leave the House, I call upon him to speak now.

There are eleven other Members who want to speak, and as the time at our disposal is limited. I request hon. Members to make their speeches as short as possible.

පී. ජී. බී. කෙනමන් මයා. (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
(திரு. பி. பி. ஜி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

Mr. Chairman, let me thank you for giving me the opportunity to enter the Debate at this stage. I intended

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to speak last afternoon, but unfortunately my doctor decided that I needed minor surgery on my arm and I was in the operating theatre. I would also like to thank all hon. Members who gave way so that I may speak.

I should like, first of all, to elaborate on a point that was touched upon by the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe), namely, what should be done about the very disturbing situation that exists in the North, particularly in the Jaffna Peninsula, in regard to relations between persons of different castes. I think it is no secret that there has been a deterioration in their relations in certain parts of the peninsula, and there have been a number of instances of violation of the law. The Hon. Prime Minister spoke on this matter a few days ago and stated that he had given instructions to the police to enforce the Prevention of Social Disabilities Act.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

They are enforcing it.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

The point I want to make is that that alone is not enough to deal with the situation.

I have had the advantage of speaking to members of the Minority Tamils' United Front, which consists of all responsible organizations representing the minority Tamils. The Minority Tamils' United Front was formed in 1966. I have had several discussions with them in the Jaffna Peninsula as well as in Colombo, and they informed me of certain matters, which I would like to bring to the attention of the Hon. Prime Minister.

It is true that prosecution for violation of the Prevention of Social Disabilities Act has been launched with success. There was the case of a barber who was prosecuted for refusing to attend upon a person of the so-called minority caste and he was fined Rs. 100, and, in retaliation, all the barber shops in the area closed down. There have also been other violations of this Act, and the police have taken action.

Now, what I want to urge upon the Hon. Prime Minister is that what is important at the moment is not so much the enforcement of the Act as the prevention of the mass terrorism, the mass economic terrorism, which has been launched against the members of the minority Tamil community in certain areas. I think hon. Members from the North will be able to speak more eloquently than I on this matter. In the Atchuvely area there have been cases of stabbing where the injured persons have been taken to hospital; in the Chankanai area there have been incidents of people being beaten up; and there have been incidents in the Kodikamam area where toddy booths have been burnt and huts in which minority Tamils lived have been destroyed. It would appear that in some areas there is a calculated attempt to rob minority Tamils of their livelihood by the destruction of the flowers of the palmyrah palm and the coconut palm. As you know, these people earn their livelihood from tapping and the sale of toddy.

පූ. භා. 11.30

Now, in my discussions with representatives of the United Front of the Minority Tamils they were at pains to stress that a number of police officers and government servants have been acting impartially in this matter. They told me that Mr. Suntheralingam, Superintendent of Police, Mr. Liyanage, Assistant Superintendent of Police, and others have been acting quite impartially and seeking to uphold the law. But according to their complaint, there is a section in the middle rung of the police in certain areas who have decided that they can be a law unto themselves and are either insulting and intimidating persons belonging to the minority communities or are

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

instigating or conniving at some of the atrocities and violations of the law. They feel that, as long as such persons remain in positions of authority in the area, it will not be possible for even the senior police officers who want the law to be enforced, actually to enforce it by taking important and concrete measures.

In fact, they mentioned certain names to me. I do not mind mentioning them here. I understand that they have complained to the Hon. Prime Minister as well. The persons mentioned were Sergeant Thamotherampillai of the Chankanai police station—if the descriptions are one quarter true, he seems to be an utter sadist, apart from being a caste-minded person—and two inspectors of the Kankesanturai police, Inspector Moorthy and another. These names have been mentioned as police officers who are making no special effort to see that the law is enforced. I urge upon the Prime Minister to tell the police officers not merely to take action in regard to the enforcement of the Prevention of Social Disabilities Act but also to see that this type of economic terrorism and physical terrorism of these persons is stopped.

There have been one or two hot-headed persons, not representing anybody, coming in and creating a lot of noise, but I do not think that is really the substance of what is going on; what is happening is that these people who represent quite a substantial part of the population of the Jaffna peninsula, feel that they now have the right to live in equality with everybody else.

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)

(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)

(Dr. E. M. V. Naganathan—Nallur)

Hear! hear.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

They are asserting that right in various forms and ways and are seeking the protection of the law, and I think that whatever they have done was only for the purpose of seeing that the law that this Parliament adopted unanimously is actually enforced and that they are given their rights. It is one thing to ask the police to see that that Act is enforced and it is another thing to see that persons who claim their rights are not victimized, penalized, punished, assaulted and even killed. I understand that one person died as a result of a shooting. There have been two or three shootings.

It may be necessary for us to re-examine the position regarding the Prevention of Social Disabilities Act —whether that Act is wide enough to deal with the problem as it exists today. It may be necessary to amend that Act and to bring in more stringent punishments for those who infringe the Act.

I hope the Prime Minister will go into the whole matter and support those officers of the law who are trying to do an honest job in the North, and see that no person in the Police Force violates the intention and the spirit of that Act.

The next matter I want to raise is this. During the Second Reading of the Budget Debate I raised the question of the Government's attitude towards the new organization called ASEAN—the Association of South East Asian Nations. On that occasion I said that it was my opinion that this was an attempt to get together a pro-imperialist bloc of nations to fill the power vacuum in South East Asia which would be caused by Britain's decision to pull out its troops and bases east of the Suez. I said that I regarded it not as an economic grouping but as the first stage for a political and even military alliance akin to SEATO.

On that occasion the Prime Minister said that his Ministry was studying the declaration and he asked me

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to raise the matter at the Committee stage, and, therefore, I am doing so now. I do not know whether he is now in a position to make a statement or whether the matter is still being studied. I shall be glad to know what the present position is.

One or two other matters. I want to know from the Prime Minister whether the Ministry of External Affairs has adopted a new policy about refusing permission to delegations from socialist countries to visit Ceylon on invitations from private organizations in this country.

There are two delegations that I am aware of which were refused admission in the recent past. One was a delegation of Buddhist monks from Buryat, Mongolia in the U. S. S. R. They have been invited by a Buddhist organization here to come to Ceylon as their guests. They applied to our Embassy in Moscow. The application was not accepted apparently on the ground that the Ministry did not think that the Buddhist organization here that had invited them was sufficiently representative of Ceylonese Buddhists. That apparently was the official excuse, but in practice——

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

What is the organization ?

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I think it is called the All-Ceylon Buddhist Congress. There are a number of Buddhist priests in that organization. Perhaps your Permanent Secretary is aware of this. And as a result this delegation could not come.

There is another case of which I could speak more categorically because it pertains to the Communist Party. The Ceylon Communist Party invited a delegation of the Hungarian Socialist Workers Party that was visiting various countries in Asia to come to Ceylon for three days as our guests and to have discussions with us, and applications were made by the representatives of the Hungarian Socialist Workers Party for visas to come to this country for three days. I went and saw some of the officials of the Ministry about this. They told me that the matter was under consideration. The net result is that the visas were never granted, and I am informed that they were refused. We did not make the application; they made the application for the visas.

Are these out of the way incidents, incidents as a result of some individual decision on specific applications, or are they part of some policy? I ask this because I want to say that it would be very regrettable if such a policy is now beginning to be developed inside the Ministry.

I also want to ask the Hon. Prime Minister whether his policy in regard to Ceylonese accepting scholarships outside Ceylon is biased in favour of any country or sets of countries? You will be aware that the Patrice Lumumba Friendship University in the U.S.S.R. offers through the Government a number of scholarships every year to Ceylon students to pursue higher studies in that country and there is an examination by a board who selects the number of students —I must say I have no quarrel with the selections; I should say their selections are rather good—and these students are sent off every year and they receive their education. I understand that the Ministry has now taken up the position that no student other than those selected by this committee that has been set up in Ceylon can be admitted to any university or higher institution in the U.S.S.R. I am aware of this personally because various international organizations like the International Students Organization, Youth Organizations and so on, offer scholarships in various places including the Patrice Lumumba

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

Friendship University in the U.S.S.R. Various people apply for these scholarships, and if there are cases of persons being selected from Ceylon for them, are they, as a result of the policy of the Government, to be refused an opportunity of receiving higher education in the U.S.S.R. ?

Secondly, I want to know why there is a one-sided policy in this matter ? As far as I am aware, any student who is able by whatever means to get a scholarship or gain entrance into universities in the United States of America or Great Britain or West Germany or France encounters no such prohibition from the Ministry. I am aware of a number of students who have gone to the universities in the United States of America on various scholarships awarded by various organizations. In these cases there has been no attempt by the Ministry to interfere with the scholarships.

I want to ask the Hon. Prime Minister, if you say you are non-aligned and if you are having one policy, then how is it that you have no uniformity in these matters in respect of all countries. If it is your position that only students you approve of can go abroad for educational purposes, then please apply the rule uniformly. Obviously, you have an opportunity of selecting the places under various agreements that you have entered into. Please do your selections, but allow other students to go if they have the opportunity to get their higher education in countries abroad without discrimination.

My next point is regarding the Peace Corps. You will recall that at the time of the last Government I was very sharply critical of the decision to bring the Peace Corps here. The last Government, I am glad to say, after the experience they had with the Peace Corps, did not renew the invitation to the Peace Corps, and the Peace Corps went back. Now I find they have again been invited. Not only have they been invited, but a batch of Ceylonese has been sent to America to teach those young men and women Ceylon customs, habits and languages.

From what I could read in the statements issued to the press by one Mrs. Dillan who is apparently the organizer of the Peace Corps here, the Peace Corps is going to recruit young people of 20 to 25 years, and they are to come here to help us with the food drive. I do not know whether that is correct or whether the Hon. Prime Minister is aware of it. But they are going to help us to grow vegetables and subsidiary foodstuffs. I do not know why they are called subsidiary foodstuffs ; substitute foodstuffs is really what is meant. Nevertheless, these young people from America, probably, have never seen a chilli plant or some of our vegetables before.

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.
(අත්තනගල්ල)
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க—அத்தனகல்ல)
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

They are coming to eat our chillies !

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

If they want to eat our chillies we will be very glad to send them some. As you know, the Peace Corps has been expelled from a number of developing Asian countries, for instance, Burma. They were accused of interfering in the internal affairs of the country and of all manner of things. I like to know, what is the purpose of bringing them ? Are we so seriously short of labour for the food drive that we have to import 30 youngsters from the U. S. A. ? They are not technicians or persons who are experts in agriculture. Or is this just a gratuitous effort to keep certain people in the U. S. A. happy that somebody is accepting their

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

unacceptable Peace Corps ? I ask my Hon. Friend, the Prime Minister to please learn from past experience and not burn everybody's fingers by such a decision as the one to bring the Peace Corps.

පූ. භා. 11.45

The last point I want to raise is the question of the Middle-East situation. As you know, we have a very vital interest in seeing that there is a just solution to that situation. The Israeli aggression against the Arab countries is not only morally and politically indefensible, but it is causing a great deal of economic troubles to Ceylon itself, principally in the shape of 17½ per cent extra surcharge on freight. I would have thought that faced with such an economic position this Government would have been more active and taken greater initiative to see that the Israeli Government withdraws its armed forces to the positions they occupied prior to their aggression on June 5th. Both from the overall political point of view and from the point of view of the direct interests of Ceylon, it is important that such a situation should not continue.

We read in the papers various initiatives taken by socialist countries—the Soviet Union, Yugoslavia and other countries—in this matter. We should like this Government, if it does not feel self-confident enough, to do so itself, together with like-minded governments in Asia, to work out some form of political initiative to see whether it is not possible to have a just solution of this problem, so that the Israeli aggression can be vacated and the Suez Canal reopened to ships which are bringing goods to us. The Government took, in my opinion, quite a good position in the debate in the United Nations, though it did not go far enough. We of the Opposition have proposed and we propose again that the Government take a unilateral decision of its own, that is, to suspend all diplomatic and other relations with the Government of Israel until such time as she stops all aggression and returns to the position her armed forces occupied prior to June 5th. Even if the Government is not prepared to take that step—that would be the best step—we would like it to take some initiative to see that there is a solution to this problem.

Once again, I thank you and the other hon. Members for their courtesy in permitting me to intervene in this Debate at this stage.

ජී. ජී. පොන්නම්බලම් මයා. (යාපනය)

(திரு. ஜீ. ஜீ. பொன்னம்பலம்—யாழ்ப் பாணம்)

(Mr. G. G. Ponnambalam—Jaffna)

Mr. Chairman, would you permit me to remark that I was extremely touched by the deep concern and care manifested in regard to the recent caste tensions in the North by two of the leaders of the Communist Party —I believe, the Russian Wing—of this House ? In itself it is to me a matter of great significance, but that apart may I be permitted to say for myself and for my party that historic social injustices must be removed and we are entirely for the removal of all social inequalities and injustices. But, I should like to say this in the interests of these people who are suffering that it is a curious menifestation that quite suddenly in some places there has been an organized attempt to incite members of these unfortunate people to display a show of force in the assertion of what is unquestionably their right.

I say on the Floor of this House that those who are either directly or indirectly responsible for the inciting of these people are neither doing them nor the people at large a service. I cannot think of anything more deplorable for a political party or parties to exploit a situation of this nature and attempt to fish in troubled waters. My own view is that if there is a feeling of urgency, as undoubtedly there is, on the part of these unfortunate persons towards a solution of this problem I believe people of light and learning, people devoted to social service, the elders of these

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පොන්නම්බලම් මයා.]

places, were attempting to bring about an understanding by the manifestation of goodwill towards them.

I should like to say the recrudescence of this trouble has been animated by political adventurers. That is manifest in two directions.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Recrudescence of violence or what ?

පොන්නම්බලම් මයා.
(திரு. பொன்னம்பலம்)
(Mr. Ponnambalam)

Recrudescence of organized trouble is definitely animated and supported by political parties.—[*Interruption*]. I am not here to educate you more than what I am saying. If you feel uncomfortable——

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I am not in the least uncomfortable.

පොන්නම්බලම් මයා.
(திரு. பொன்னம்பலம்)
(Mr. Ponnambalam)

Then why do you not just keep quiet and listen.

Now, so much for that. The hon. Member for Kolonnawa (Mr. Ilangaratne) made an interesting reference to the disparity with which the coup suspects—if I may use that expression—are being treated as between the year 1960-61 and the year of Grace 1966. The matter is *sub judice* now, but may I say this, that the sadistic behaviour of the then Permanent Secretary in regard to the treatment of those suspects, in the earlier case can hardly be impeached by anybody. I say this not as a person who participated in the trial but as we took the matter up before the Supreme Court as an interim matter by way of a writ of mandamus. I would seriously invite my hon. Friend the Member for Kolonnawa to read the observations of the then Chief Justice in regard to the denial of fundamental human rights to those who are suspects and then are found guilty.

Be that as it may. I shall get on to two comparatively minor points. The Hon. Prime Minister yesterday referred to the necessity of maintaining a unit of the army in the North. He said the necessity arises because of the danger of illicit immigration and smuggling. He is welcome to take all the measures necessary to combat these two anti-social activities. But may I say this ? In doing so, do not place your army right in the heart of some place where people live, where active provocation can go on by their continually coming into contact with the civilian population. That is what we object to. There are vast open spaces wherein the army can be properly located. That is all right, but please remove them from the centre of this kind of irritation and disgust. This is my very strong submission, and I do hope my Friend the Hon. Prime Minister will give weight to my submissions on this subject.

One other matter in regard to the army : it is a matter I am afraid the Hon. Prime Minister probably has not had the time to give thought to. It is the conduct of certain members of the army at Trincomalee. There was a shrine at Fort Frederick which was accessible to Hindu devotees for quite some time. For reasons which are completely beyond human understanding, some members of the army have denied access to this small Hindu shrine. I do not precisely know what particular active invasion this army at Trincomalee presently anticipates, but, whatever that may be, there seems to be no excuse whatsoever for the army or anybody to deny to perfectly harmless, peaceful devotees and worshippers, access to a small shrine. I do hope the Hon. Prime Minister will not hesitate to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

make the orders necessary to clear the path and prevent these army men from officiously preventing and harshly interrupting Hindu worship at Trincomalee.

One other matter I wish to mention is in regard to the navy in the North. There has hardly been, to my knowledge, any complaint in regard to the conduct of navy personnel. They have, I believe, quite a few boats which can be used when they are disposed to help in certain activities. I should like to pay a tribute to the rescue service that is being extended to the poor fishermen by the navy.

There are two other matters in which, I am assured by the Commodore, if directed by the External Affairs Ministry they can be of considerable service, namely, the anti-social activities of certain men in dynamiting fish and also, because of the short supply of fishing gear by way of nets and so on, the tendency for organized thefts of nets. In regard to these matters, there is little or no expense. The Government and the Ministry of Fisheries can considerably be assisted if the services of navy personnel are requisitioned and directed along these lines.

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

Order please! The Sitting is suspended till 2 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 P.M. and then resumed.

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

How long will the Hon. Prime Minister want to reply?

ගරු ඩඩ්ලි සේනානායක

(கௌரவ டட்லி சேனநாயக்க)

(The Hon. Dudley Senanayake)

An hour at least.

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

Normally this Vote should have been over at 2.30 P.M. Even if we go on till 4 o'clock, the speeches will have to stop at 3 P.M. to give the Hon. Prime Minister a chance of replying. Kindly keep that in mind. There are ten more Members who want to speak. At 3 o'clock I shall call upon the Hon. Prime Minister to reply.

එස්. ඩී. බණ්ඩාරනායක මයා. (ගම්පහ)

(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)

(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු සභාපතිතුමනි, රාජ්‍යාරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යට තේ වචන ස්වල්පයක් කථා කරන්නට සතුටුයි. විශේෂයෙන්ම, ඊයේ-පෙරේදා චීන මහජන සමූහාණ්ඩුව ලංකාවේ පිහිටි සිය තානාපති කාර්යාලයට එවන ලද භාණ්ඩ පිළිබඳව අගෝස්තු 2 වැනිදා සිට 5 වැනිදා දක්වා සිදු වූ දේ ගැන කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. නැති වූ භාණ්ඩ හිතාමතාම කරන ලද හොරකමක් හැටියට මේ ආණ්ඩුවම පිළිගෙන තිබෙනවා. ඒ අතරම මේ ආණ්ඩුව ඒ සොරකම සුළු දෙයක් ලෙස පෙන්වා මඟ හරින්නට උත්සාහ කරන බවත් පෙනී යනවා. විනාශ කර තිබෙන පොත්පත් ගැන බැලුවාම—මාඕ සේතුං තුමාගේ චින්තන අඩංගු පොත ගැනම බැලුවාම-ඒ පොතේ මුල් පිටුවේ තිබුණු සභාපති මාඕ සේතුං ශ්‍රේෂ්ඨ නායකයාගේ පින්තූරය කෑලිවලට ඉරා දමා, නොයෙක් නොයෙක් ආකාරයට විනාශ කර තිබෙන බව පෙනෙනවා. මේ නැති වූ භාණ්ඩ චීන තානාපති කාර්යාලයට රාජ්දූත සේවා ද්‍රව්‍ය වශයෙන් එවන ලද ඒවායි. එමනිසයි ලංකාවේ චීන තානාපති කාර්යාලය ඒ ගැන මේ ආණ්ඩුවට පැමිණිලි කෙළේ. භාණ්ඩ විනාශයට පත් කරනු ලැබූ අවස්ථාවේ මේ නැව තිබුණේ කොළඹ වරායේ නිසා එහි ආරක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

භාව පිළිබඳ ප්‍රශ්නය සහ එහි වගකීම මේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම භාර ගත යුතු යයි සඳහන් කරන්නට සතුටුයි. මේ ක්‍රියාවන් ගැන බැලුවාම මෙය ලංකාවේ සිටින ප්‍රතිගාමී සුළු කොටසක්, ප්‍රකෝප කිරීමක් වශයෙන් ගෙන ගිය චීන විරෝධී ක්‍රියා හැටියට පෙනී යනවා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

කොහොමද ඒක එහෙම පෙනී යන්නේ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

ලංකා-චීන මිත්‍රත්වය නැති කිරීම උදෙසා ගෙන ගිය කුමන්ත්‍රණයක් හැටියට මෙය පෙනෙනවා. චීනයේ තානාපති කාර්යාලය මේ සිද්ධිය ලංකාවත් චීනයත් අතර තිබෙන සම්බන්ධතාව නැති කිරීම උදෙසා ගෙනගිය කුමන්ත්‍රණයකැයි මේ ආණ්ඩුවට දැන්වූයේ එම නිසයි. ඒ කුමන්ත්‍රණයට මේ ආණ්ඩුවේ සුළු නිල ධාරීන් පිරිසකුත් සම්බන්ධවෙලා තිබෙන බව පෙනෙනවාය යන්න සඳහන් කර තිබුණේ ඒ අනුවයි. එහෙත් චීන තානාපති කාර්යාලය ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට ඇඟිලි ගසනවායැයි ලංකාණ්ඩුව චීන තානාපති කාර්යාලයට දන්වා තිබෙනවා. මේ අනුව කවුරුන් විසින් කාගේ අභ්‍යන්තර ප්‍රශ්නවලට ඇඟිලි ගසනවාදැයි පරීක්ෂා කර බලන්නට වටිනවා.

1965 පැවැත්වුණු මහා මැතිවරණය ගැන කාටත් මතක ඇති. ඒ මහා මැතිවරණයේදී මෙම ආණ්ඩුවේ උසස් අය කීවේ ඩඩ්ලි සේනානායක මහතා පස්සේ චීනුන් යන බවයි. එදා ඒ විධියේ චෝදනාවක් කළා. ඊළඟට පසුගිය අවුරුදු දෙක හමාර තුළ සිදු වී තිබෙන්නේ මොනවාද? මෙම ආණ්ඩුවේ උසස් ඇමතිවරුන් පස් දෙනකු චීන මහජන සමූහාණ්ඩුවට විරුද්ධව ප්‍රසිද්ධියේ පහර ගසා තිබෙනවා. මුලින්ම මාක්ස් විරෝධී සංගමයේ සභාපතිවරයා වන මෙම ආණ්ඩුවේ කම්කරු හා නිවාස ඇමතිවරයා—ගරු එම්. එච්. මොහමඩ්—කීවේ, චීනය එහි සිටින මුස්ලිම් ජනතාවට හිරිහැර කරන බව හා ඒ ගැන සොයා බැලීමට ජාත්‍යන්තර තත්ත්වයේ පරීක්ෂණයක් පැවැත්විය යුතු බවයි. කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ ඒ චෝදනාව වැරදි බව ඒ අවස්ථාවේදී ලංකාවේ සිටින චීන තානාපතිතුමා ප්‍රකාශ කළා. එසේ ප්‍රකාශ කළායින් පසුව තමන් විසින් කරන ලද වරද ගැන ඒ ඇමතිතුමා කනගාටුව ප්‍රකාශ කෙළේ නැහැ. ඊළඟට චීනයට චෝදනා කෙළේ රාජ්‍ය ඇමතිතුමායි. රාජ්‍ය ඇමතිතුමා—ගරු ජේ. ආර්. ජයවර්ධන—අගමැතිවරයා හැටියට වැඩ බලද්දී ලංකා ගමනාගමන මණ්ඩලයේ රැස්වීමකදී ප්‍රකාශ කෙළේ සෝවියට් දේශයේ හෝ චීනයේ හෝ වාගේ ඒකාධිපති ආණ්ඩුව කට තමන් විරුද්ධ බවයි. ඊළඟට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා—ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක—මීගමුවේ අතුරු මැතිවරණ රැස්වීමකදී කථා කරමින්, වාමාංශික මාක්ස්වාදීන් බලයට පැමිණිය හොත් චීනයේ මෙන් වහල් කඳවුරු ඇති කර මේ රටේ පූජකවරුන් ඒ කඳවුරුවලට දමනු ඇති බව සඳහන් කළා. ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා—ගරු එම්. ඩී. බණ්ඩා—පසුගිය අවුරුද්දේදී මෙම ගරු සභාවේදී පිබිදෙන මල් සියයක් ගැන කථා කරමින්, "දැන් හිස් සේරම ගසා දමලා; එක ඔලුවක් පමනයි තිබෙන්නේ" යනුවෙන් සඳහන් කර චීනයේ සාංස්කෘතික විප්ලවය සමච්චලයට භාජන කළා.

1966 මාර්තු මස 19 වැනිදා ඩේලි නිව්ස් පත්‍රයේ පළ වූ ගරු අගමැතිතුමා වොෂිංටනයේදී කරන ලදැයි කියන ප්‍රකාශය අනෙක් කාරණයයි. "චීන මහජන සමූහාණ්ඩුව සහ තායිවානය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංගමය කෙසේ ක්‍රියා කළ යුතුදැයි ලංකාණ්ඩුව තීරණයක් කර නැත" යන්න ඒ ප්‍රකාශයයි.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

මොකක්ද ඔය කියන්නෙ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

මේ තමුන්නාන්සේ වොෂිංටනයේදී කරන ලද ප්‍රකාශයක්. 1966 මාර්තු මාසයේ 19 වැනිදා මෙය "ඩේලි නිව්ස්" පත්‍රයේ පළ වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
ආයෙත් කියන්න.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
"චීන මහජන සමූහාණ්ඩුව සහ තායිවානය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංගමය කෙසේ ක්‍රියා කළ යුතුදැයි ලංකාණ්ඩුව තීරණයක් කර නැත."

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
අමූලික බොරුවක්.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
ගරු අගමැතිතුමා අද මෙම ප්‍රකාශය කරන තුරු අප දැන සිටියේ නැහැ, ඒ කතාව බොරුවක් බව. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවා යැයි කියන මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් කරුණු ප්‍රචාරය වන්නේ එහෙමයි. අප මේවා දැනගන්නේ පත්‍ර මාර්ගයෙනුයි. මේ ආකාරයට මෙම ආණ්ඩුවේ වග කිවයුතු ඇමතිවරුන් චීන විරෝධී ප්‍රකාශ කරන අතර චීන විරෝධී ක්‍රියා මාර්ගද අනුගමනය කරන බව පෙනෙනවා. තායිවානයේ සිට ළඟදී ලංකාවට බාල දක්ෂ මානවිකා නියෝජිත පිරිසකට පැමිණෙන්නට ඉඩ දුන්නා. එසේම 1967 දෙසැම්බර් මාසයේදී තායිවානයේ සිට බොක්සිං නියෝජිත පිරිසකට පැමිණෙන්නට ඉඩ දී තිබෙනවා. ගිය අවුරුද්දේ තායිවානයේ සිට ටෙනිස් ශූරතා තරගයක් සඳහා යම් පිරිසකට පැමිණෙන්නට ඉඩ දුන්නා. ගිය අවුරුද්දේ ලෝක බෞද්ධ සම්මේලනයක් සඳහාද තායිවානයේ නියෝජ්‍ය පිරිසකට සහ දලයි ලාමාගේ නියෝජිත පිරිසකට එන්නට ඉඩ දුන්නා. ඒවාගේම ගිය අවුරුද්දේ වෙළඳ සම්මේලනයක් සඳහාද තායිවානයෙන් නියෝජිත පිරිසකට එන්නට ඉඩ දුන්නා. එපමණක් නොවෙයි, පසුගිය කාලයේදී වී වැපිරීම පිළිබඳව ඉගෙන ගැනීම සඳහා මේ රටින් තායිවානයට හය දෙනකු යැවීමට ඉඩ දී තිබෙනවා. ඒ ආකාරයට මෙම ආණ්ඩුව ඇමෙරිකන්——

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
තායිවානයට ලංකාණ්ඩුව මගින් පිටත් කළාද?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
මෙම ආණ්ඩුව ඒ අයට යන්න හෝ ලංකාවට ඒමට බලපත්‍ර දී තිබෙනවා. බලපත්‍ර නොදී කොහොමද එන්නෙ? මේ ආණ්ඩුව ප්‍රසිද්ධියේම අමෙරිකන් අධිරාජ්‍යවාදීන් සමග එකතුවී ලෝකයේ චීන රාජ්‍ය දෙකක් ඇති කිරීම පිණිස කුමන්ත්‍රණයක යෙදී සිටින බව පෙනෙනවා. අපේ විදේශ ප්‍රතිපත්තිවලට පටහැනිව චීන රාජ්‍යයන් දෙකක් ඇති කිරීමේ කුමන්ත්‍රණයක මෙම ආණ්ඩුව යෙදී සිටිනවාය කියන එකයි, අපේ චෝදනාව.

පසුගිය අවුරුදු දෙක හමාර ඇතුළත චීන මහජන සමූහාණ්ඩුවෙන් ලංකාවේ චීන තානාපති කාර්යාලයට එවන ලද සහ ලංකාවේ චීන තානාපති කාර්යාලයෙන් යවන ලද භාණ්ඩ 14 වතාවක්ම පරීක්ෂා කර තිබෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කොහොමද දන්නේ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
මා දන්නවා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
ඔය බැජ් එක මොකක්ද?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
මේ බැජ් එක, මාඕ සේතුං තුමාගේ බැජ් එක. තමුන්නාන්සේලා මේ බැජ් එකට බයයි. තමුන්නාන්සේලා මේ තරම් බය මොකද මේ බැජ් එකට?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

කෝ බණ්ඩාරනායක බැජ් එක ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

චීන සමූහාණ්ඩුව මඟින් ලංකා කොමියුනිස්ට් පක්ෂයට, ලංකා-චීන මිත්‍ර සංගමයට, චීන තානාපති කාර්යාලයට, ශින්වා ප්‍රවෘත්ති ආයතනයට සහ වෙනත් නොයෙකුත් පුද්ගලයන්ට එවනු ලබන පොත් පත් සඟරා සියල්ල තහනම් කරලා. [බාධා කිරීමක්] වරායේ වැඩ කරන, ආණ්ඩුවේ එක්තරා චීන විරෝධී උසස් නිලධාරි මහතෙක් ඊයේ උදේ මේවා එකතු කර පුළුස්සා දමා තිබෙනවා.

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. டீ. ஷெல்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

I ask your permission to leave the Chamber rather than be seated alongside or together with a traitor to the country. It is a disgrace—[*Interruption*].

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

Get out !

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

It is a disgrace to this country.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Order, please !

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(දොම්පෙ)
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)
(Mr. F. R. Dias Bandaranaike—Dompe)

On a point of Order, Sir. Remarks like that should not be permitted in this House.—[*Interruption*].

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

It applies to you also.—[*Interruption*]. It is a disgrace.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

The hon. Member must withdraw those words.

අ. භා. 2.15

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

සභාපතිතුමනි, කසිප්පු ගැනුවම කථා කරන්නේ ඔහොම තමා. [බාධා කිරීම්]

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

I do not think that the hon. Member should also say things like that.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

The hon. Member should not be permitted to use words like that.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

මේ පොත්පත්වල තිබෙන්නේ මොනවා දැයි මේ ආණ්ඩුව විස්තර අසා තිබෙනවා. මේ පොත්පත් සමඟ එවූ ලියකියවිලිවල එම විස්තර තිබෙන බව මේ ආණ්ඩුවම දන්නවා. මේ ආණ්ඩුව විශේෂයෙන් ගුවන් විදුලි සංසථාව මඟින් චීනයටත්, සංස්කෘතික විප්ලවයටත්, සභාපති මා ඕ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේතුං තුමාටත් විරුද්ධව නොයෙක් ආකාරයට බැණ වදිනවා.

ලංකාවේ සිටි චීන තානාපතිතුමා 1965 දෙසැම්බර් මාසයේ දී චීනයට ගියා. එතුමාට පසුව පත් කළ චීන තානාපතිතුමා පිළිගැනීමට මේ ආණ්ඩුව ලැහැස්ති නැති බව, විශේෂයෙන් 1966 අප්‍රේල් මාසයේ ගරු අගමැතිතුමා වොෂින්ටන් නගරයේ සිට ආපසු ලංකාවට පැමිණි පසුව තීරණය කර දැනුම් දුන්නා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
මොකක් ද?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
මේ ආණ්ඩුව, චීනයේ අළුත් තානාපතිතුමා පිළිගැනීමට සූදානම් නැති බව.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
කවුද කීවේ? දැන් ඇවිත් සිටින තානාපතිතුමා නොවෙයි ද?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
1966 අප්‍රේල් මාසයේ වොෂිංටන් නගරයේ සිට අගමැතිතුමා ආපසු ලංකාවට ආවාට පස්සේ දුන් තීරණයක්, මේ.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
මා ඒ ගැන කියන්නම්.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
අළුත් තානාපතිතුමා පිළිගැනීමට මේ ආණ්ඩුව සූදානම් නැති බව සඳහන් කර තිබෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කොහේද?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
No, Sir. I will speak generally on the matter. I want to remove the impression that he is creating. Before any diplomatic representative is accredited, the Government is asked whether the person is acceptable, and the Government after, in many cases, say "yes"; where it says, "no" another person is accredited. That is what happened.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
තානාපතිතුමා පිළිගැනීම තමුන්නාන්සේ ප්‍රතික්ෂේප කළා නේ ද? ඒකයි, මා අහන්නේ.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
Not a representative, but that particular representative they wanted to send.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
මොන හේතුවක් නිසාද?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
හේතුත් මම කියන්නම්.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
You are well briefed.

එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.
(මිනුවන්ගොඩ)
(திரு. எம். பீ. டி சொய்ஸா சிறிவர்தன—மினுவாங்கொட)
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)
By whom?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
Ask him.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
Briefed by Robert.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

මේ රටේ සෑම ප්‍රවෘත්ති පත්‍රයක්ම දින පතාම පාහේ චීනයට, චීනයේ සංස්කෘතික විප්ලවයට, සභාපති මා ඕ සේතුං තුමාට විරුද්ධව නොයෙක් ආකාරයෙන් පහර ගහනවා. ඊයේ පෙරේදා චීන තානාපති කාර්යාලයට රාජ්‍ය දූත සේවා ද්‍රව්‍ය වශයෙන් එවූ දේවල් සමග පදක්කම් 300 ක් තිබුණා. සභාපති මා ඕ සේතුං තුමාගේ ඒ පදක්කම් 300 ත් මේ ආණ්ඩුව තහනම් කළා. එම පදක්කම් වලටත් මේ ආණ්ඩුව ඒ තරම්ම භයයි. පදක්කමට මේ තරම් භය වන්නේ ඇයි? මාත් පැළඳගෙන ඉන්නා මා ඕ සේතුං තුමාගේ පදක්කමට තමුන්නාන්සේලා කොයි තරම් භයද? [බාධා කිරීම්] මේ රටේ දියුණුව සඳහා, සුභ සිද්ධිය සඳහා තමුන්නාන්සේලා වැඩ කරනවා නම් මේ පදක්කමට ඔය තරම් භය වන්නේ ඇයි?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කෝ, බෝසත් බණ්ඩාරනායක?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

මේ ආණ්ඩුව මා ඕ සේතුං චින්තනයට මේ තරම් භය වී, ඒ පොත්පත් පුළුස්සා දමනවා. සභාපති මා ඕ සේතුං තුමාගේ පදක්කම අද මේ රටේ ගොවියන්ගේ හා කම්කරුවන්ගේ, විමුක්ති කාමී සටනේ ලාංඡනයක්. වෙනකක් තබා මේ රටේ රැකී රක්ෂා නැති දස ලක්ෂයක් පමණ වූ තරුණයන් ගේත් ලාංඡනයක්, මේ පදක්කම. එම නිසා ඒ තරුණයන් චීන තානාපති කාර්යාලයට ගිහින් එම පදක්කම් ඉල්ලුම් කරනවා. මහ ලොකුවට පුරසාරම් දොඩන මේ ආණ්ඩුව පදක්කම් 300 කට මේ තරම් භය වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේවා සියල්ලක්ම පෙන්නුම් කෙරෙන්නේ මේ ආණ්ඩුව චීනයේ අභ්‍යන්තර ප්‍රශ්නවලට ඇඟිලි ගැසීම නිසයි. මෙය අධිරාජ්‍යවාදීන් සමග අත්වැල් බැඳගෙන ගෙනයන ව්‍යාපාරයක් හැටියටයි අපට පෙනෙන්නේ. සම්පූර්ණයෙන්ම අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ට කන් අදින අග්නි දිග ආසියා සංවිධානය—පිලිපයින්, මැලේෂියාව, තායිලන්තය, ඉන්දුනීසියාව යන රටවල්—මේ ආණ්ඩුව සම්බන්ධ කර ගෙන දැන් නොයෙක් නොයෙක් චීන විරෝධී කුමන්ත්‍රණ කරගෙන යනවා. ඒ කටයුත්තට මේ ආණ්ඩුව සම්බන්ධ කර ගැනීමෙන් ඒ සංවිධානය බලාපොරොත්තු වන්නේ අප චීනය සමග ඇති කර ගෙන තිබෙන හාල්-රබර් ගිවිසුම කෙසේ හෝ අහෝසි කිරීමේ ක්‍රියාමාර්ගයක් ඇති කර ගැනීම බව මතක් කරන්න කැමතියි. මේ ආණ්ඩුව ගෙන යන ක්‍රියා මාර්ගය අනුවත් මේ ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තිය අනුවත් චීන ජනතාවට පෙනී ගොස් ඇත්තේ මේ රටේ දැන් තිබෙන ආණ්ඩුව චීන විරෝධී හතුරු ආණ්ඩුවක් හැටියට බව කීවොත් තමුන්නාන්සේලා පුදුම වෙනවාද? චීනය අද තමුන්නාන්සේලා දෙස බලන්නේ හතුරකු දෙස බලන ආකාරයටයි. ඒ නිසා චීනයේ තිබෙන ලංකා තානාපති කාර්යාලය රතු හට හමුදාව විසින් වටකිරීම පුදුමයක් ද? අමෙරිකන් අධිරාජ්‍යවාදීන් අද ලෝකයේ තිබෙන විමුක්තිකාමී හා නිදහස්කාමී සටන්වල ප්‍රධානම හතුරා බව ලෝකයේ සිටින කවුරුත් පිළිගත් දෙයක්. මේ වර්තමාන ආණ්ඩුවත් අමෙරිකන් අධිරාජ්‍යවාදීන් සමග එකතු වී චීනයට විරුද්ධව කුමන්ත්‍රණයක් ගෙනයනවාය කියන අවබෝධයක් චීන ජනතාව තුළ තිබෙන නිසා ඒ ගැන විරුද්ධත්වය ප්‍රකාශ කිරීම පිණිසයි චීනයේ සිටින රතු හට හමුදාව පවා ඔය පියවර ගෙන තිබෙන්නේ කියන කරුණ මේ රජය පිළිගන්නට ඕනෑ.

ආසියාවත්, අප්‍රිකාවත්, ලතින් අමෙරිකාවත් අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව විමුක්තිකාමී සටන් ආරම්භ කර ඇති මෙවැනි අවධියක අමෙරිකාව කඩදාසි කොටියෙක් හැටියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වියට්නාම් ජනතාව තම වීරෝදාර ක්‍රියා වලින් මුළු ලෝකයටම ඔප්පු කර තිබෙනවා. එපමණක් නොවෙයි අප්‍රිකාව දෙස බලන්න. එහි නීග්‍රෝ ජාතිකයින් තමන්ගේ විමුක්තිය සඳහා අධිරාජ්‍යවාදීන්ට විරුඬව අද විශාල සටනක් ගෙන යනවා. රොඩේසියාව ගැන බලන විට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් මොන බොරුකාර කපටි කෛරාටික සුද්දන්ද කියා ඔප්පු වී තිබෙනවා. වැනිසියුලාව, මෙක්සිකෝව හා ඩොමිනිකන් සමූහාණ්ඩුවත් අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව විමුක්තිය සඳහා විශාල සටනක් ගෙන යනවා. උතුරු අමෙරිකාවේ නීග්‍රෝ ජාතිකයින් සුදු අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව අද විශාල වශයෙන් සටන් ආරම්භ කර තිබෙනවා. එමෙන්ම මැද පෙරදිග අරාබි ජනතාව අද විප්ලවකාරී ගරිල්ලා ක්‍රියා මාර්ගයකින් තොරව තමන්ගේ විමුක්තිය ලබාගන්නට බැරිය කියා තීරණයක් ගෙන තිබෙනවා. ඒ වාගේම ඉන්දියාවේ නක්සල්බරි ආදී බොහෝ ප්‍රදේශවල, ඒ රටේ ප්‍රතිගාමී ආණ්ඩුවට විරුද්ධව විප්ලවකාරි ආකල්ප යකින් යුත් සටන් සිදු වන බව අප කවුරුනුත් දන්නවා.

තමන්ගේ විමුක්තිය සඳහා අද ලෝකයේ සෑම තැනකම පාහේ ජනතාව විප්ලවකාරී සටන් ගෙන යනවා. අවුරුදු දස දාහක ශිෂ්ටාචාරයක් තිබෙන චීනය සභාපති මාඕ සේතුං සහ චීන කොමියුනිස්ට් පක්ෂය අද අධිරාජ්‍ය වාදයට සහ නව යටත් විජිත වාදයටත් විරුද්ධව මාක්ස් ලෙනින් වාදය අනුව විප්ලවකාරී මාර්ගදේශකත්වය මුළු ලෝකයේම ජාතික නිදහස උදෙසා සටන් කරන රටවලට දී තිබෙන බව අප කවුරුනුත් පිළිගත යුතුයි. ලෝකයේ නොයෙක් ජාතීන් නිදහස උදෙසා, විමුක්තිය උදෙසා, ගෙන යන සටන් අද සෝවියට් සංශෝධනවාදීන් විසින් පාවා දී තිබෙන බවද අප පිළිගත යුතුයි. විමුක්ති සටන් සඳහා අත දීමට සිටින්නේ සභාපති මාඕ සේතුං සහ චීනයේ කොමියුනිස්ට් පක්ෂය පමනක් බව අද අධිරාජ්‍යවාදීන් හොඳ හැටි දන්න කරුණක්.

චීනය ඉතාමත් සාර්ථක ලෙස ජලකර බෝම්බය පිපිරවීමෙන්, මෙතෙක් කල් අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ටත් සෝවියට් සංශෝධන වාදීන්ටත් තිබුණ ඒකාධිකාර යක් සම්පූර්ණයෙන්ම කඩා දමා තිබෙනවා. ඒ වාගේම, ලෝකය මහා යුද්ධයකින් විනාශ වෙනවායැයි කියන, යටත් විජිත විප්ලවකාරී රටවල් භය කිරීමේ "බ්ලැක්මේල්" ක්‍රියා මාර්ගය අද චීනය සම්පූර්ණයෙන්ම අහෝසි කර තිබෙනවා. රටක් විදේශ ප්‍රතිපත්තිය අතින් අර කඳවුරටවත් මේ කඳවුරටවත් නොබැඳී මධ්‍යසථ භාවයෙන් සිටිය යුතුය යන කීම අද විහිළුවක්, මහත් ප්‍රෝඩාවක්, වී තිබෙනවා. මැද පෙරදිග අරාබි ලෝකයේ මධ්‍යසථ රටවල නායකයාව සිටි නසාර් තුමාට සිදු වුණු දෙයින්ම එය පැහැදිලි වෙනවා. එක් පැත්තකින් සෝවියට් සංශෝධන වාදීන් අරාබි ජනතාවගේ සටන පාවා දුන් අතර, අනෙක් පැත්තෙන් අමෙරිකන් අධිරාජ්‍යවාදීන් ඊශ්‍රායලයට සහයෝගය දුන්නා. එම නිසා ඒ මධ්‍යස්ථ භාවය තේරුමක් නැති දෙයක් බව මුළු ලෝකයම පිළිගන්නවා. මීට අවුරුදු 10 කට පමණ කලින් නසාර්තුමා නේරුතුමා වැනි අය එදා පිළිගත් ඒ මධ්‍යස්ථභාවයෙන් යහපතක් සිදු වන්නට ඇතැයි අපට කල්පනා කරන්න පුළුවන්.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
මධ්‍යම ප්‍රතිපදාව.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
තමුන්නාන්සේ ඔය ප්‍රකාශ කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අදහස්ද?

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
මාඕ සේතුංගේ අදහස්.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
1965 මාර්තු මාසයේදී මේ රටේ ජනතාව රවටන්නට මේ ආණ්ඩුවට පුළුවන් වුණා. එහෙත් චීනයේ ජනතාව රවටන්නට තමුන්නාන්සේලාට බැහැ. [බාධා කිරීම්] මේ රටේම ජනතාව වුවත් හැමදාම රවටන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]
නට තමුන්නාන්සේලාට පුළුවන් වන්නේ නැහැ. ඒ යුගය අවසානයි. අධිරාජ්‍යවාදීන් විසින් අටවා තිබෙන පාර්ලිමේන්තුව නමැති මේ හොර ගුහාව, මේ සැලැස්ම—

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
Parliament was called a *hora guhawa.*

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
Did you refer to Parliament as a *hora guhawa* ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
සභාපතිතුමනි, මා කියන්නේ, අධිරාජ්‍ය වාදීන් විසින් අටවා තිබෙන මේ සැලැස්ම අහෝසි කළ යුතු බව මේ පැත්තත් ඒ පැත්තත් පිළිගන්නා බවයි.

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)
නෑ, නෑ. [බාධා කිරීම්]

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)
You resign from Parliament.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
Order, please! Please withdraw the words "*hora guhawa*" with reference to Parliament. You cannot refer to Parliament as a "*hora guhawa*".

අ. භා. 2.30

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
තමුන්නාන්සේගේ ඉල්ලීම පිට සම්ප්‍රදායානුකූලව මම ඒ වචනය ඉල්ලා අස් කර ගන්නව. එහෙත් අධිරාජ්‍යවාදීන් විසින් අටවා තිබෙන මේ සැලැස්ම පොලීසිය හා ත්‍රිවිධ හමුදාව මගින් ආරක්ෂා කර නව. ඒ හමුදාවල සේවකයින්ට අඩු පඩි යක් දීල ආරක්ෂා කරන්නේ මේ අධිරාජ්‍ය වාදීන් අටවා තිබෙන සැලැස්ම බව ඒ හමුදා භටයින් දන්නව. එම නිසා මේ රටේ ගොවීන් සහ කම්කරුවන්, විශේෂ යෙන්ම තරුණයන්, ඒ විමුක්තිකාමී පෙර මුණ පිහිටුවීමේදී පොලීසියේ හා ත්‍රිවිධ හමුදා භටයන් පවා වැඩි කල් යන්ට පෙර ඔවුන් සමග එක පෙරමුණට එන බව මේ ආණ්ඩුවට මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
I wish to remind hon. Members that at 3 o'clock I shall be calling upon the Hon. Prime Minister to reply. These Heads should have been finished by 2.30 p.m.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
May we have another hour? You can take that from the time allotted for the Planning Ministry Votes.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන් තොට)
(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந் தோட்டை)
(Dr. N. M. Perera—Yatiyantota)
I like to suggest that the whole of the time allotted for the Planning Ministry be taken up for a discussion on these Heads.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
If it is agreed, I have no objection.

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)
Agreed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Then you want to go on till 6 P.M. with these Votes ?

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)

Yes.

එච්. කුලරත්න මයා. (රක්වාන)
(திரு. எச். குலரத்ன—றக்குவான)
(Mr. H. Kularatne—Rakwana)

ගරු සභාපතිතුමනි, පුපුරණ ද්‍රව්‍ය පාලනය කිරීමේ කටයුත්ත භාරව තිබෙන්නෙ ආරක්ෂක අමාත්‍යාංශයටයි. අද පුපුරණ ද්‍රව්‍ය පාලනය කරන ක්‍රමය නිසා ගම්බද කර්මාන්ත හැම දෙයකම වාගේ වැඩ ප්‍රමාද වීමට හේතු රාශියක් පැන නැගී තිබෙනව. විශේෂයෙන්ම ගොවි ජන සේවා අංශය මගින් දැන් අවුරුදු 2 කට පමණ කලින් ආහාර නිෂ්පාදනය දියුණු කිරීම සඳහා කරගෙන ගිය සුළු වාරිමාර්ග කට යුතු සියල්ලක්ම වගේ මේ නිසා අද අඩ පණ වී තිබෙන බව කණගාටුවෙන් මතක් කරනව. සමහර ඒවා කොන්ත්‍රාත් දෙන්ට අමාරු වී තිබෙන අතර, තවත් සමහර ඒවා කොන්ත්‍රාත් භාර ගත් උදවියට අවසාන කරන්ට බැරි වී තිබෙනව. මේ තත්ත්වය ඇති වීමට හේතුව කුමක්ද? පුපුරණ ද්‍රව්‍ය පාලනය කරන්නෙ ආරක්ෂක අමාත්‍යාංශ ය මගිනුයි. ගම්බද ගම්කාර්ය සභාවල යම් යම් වැඩ කටයුතු සඳහාත්, ගොවිජන සේවා අංශයේ යම් යම් වැඩ සඳහාත්, පාඨශාලා ගොඩනැගිලි සෑදීම ආදිය සඳහාත් ටෙන්ඩර් කැඳවීමේදී සමහරවිට ඒ වැඩ භාර ගැනීමට කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් වෙන්නෙ නැහැ. එසේ නැතහොත් කොන්ත්‍රාත් භාර ගත්තත් ඒ උදවිය නියමිත කාලසීමාව තුළ ඒ වැඩ නිම කර භාර දෙන්නෙ නැහැ. මීට හේතු වී තිබෙන්නෙ පුපුරණ ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති දුෂ්කරතාවයි.

පුපුරණ ද්‍රව්‍ය පාලනය කිරීම ආරක්ෂක අමාත්‍යාංශයට පැවරී තිබෙන කාර්යයක්. කෙනෙක් ඒ ද්‍රව්‍ය ලබා ගැනීමට දිසාපතිතුමාගෙන් අවසර පත්‍රයක් ඉල්ලා සිටියාම ඒ අවසර පත්‍රය ලැබෙන්න මාස තුන හතරක් පමණ ගත වෙනව. දැනට පවතින ක්‍රමය අනුව දිසාපතිතුමාට එවැනි ඉල්ලුම් පත්‍රයක් ලැබුණාම එතුමා පොලිසියට දන්වා ඒ පුද්ගලයාට මේ ද්‍රව්‍ය අවශ්‍ය ද නැද්දැයි පරීක්ෂා කරනවා. ඒ සඳහා මාසයක් විතර ගත වෙනව. පසුව ඒ ඉල්ලීම පොලීසියෙන් කච්චේරියට ඇවිත් ආරක්ෂක අමාත්‍යාංශයට හෝ ගාල්ලේ සිටින පුපුරණ ද්‍රව්‍ය විශෙෂඥ තැන වෙත හෝ යනව. මා හිතන්නෙ ලංකාවේ පුපුරණ ද්‍රව්‍ය පිළිබඳ විශේෂඥයකු වශයෙන් සිටින්නේ ගාල්ලේ සිටින මහත්මයා පමණයි. එහිත් සුමාන 3 ක් විතර ප්‍රමාද වී කච්චේරියට ගිහින් ඉල්ලුම්කරුට අවසර පත්‍රය ලැබෙන්න තවත් මාසයක් විතර ගත වෙනව.

මේ කාරණය නිසා දැන් රත්නපුර දිස්ත්‍රික්කයේ ආහාර නිෂ්පාදන කටයුතුවලට ලොකු බාධාවක් ඇති වී තිබෙනව. ඒ ප්‍රදේශයේ ගොවි ජන සේවා අංශයේ කොන්ත්‍රාත් දැන් කවුරුවත් භාර ගන්නෙ නැති තත්ත්වයක් පවතිනව. කච්චේරියේ එල්ලා තිබෙන ලැයිස්තුවේ වැඩ 60ක් විතර කොන්ත්‍රාත් දීමට තිබෙන බව සඳහන් වෙනව. ඒවා කිසි කෙනෙකු භාර ගන්නට සතුටු නැහැ. මේ කරදරය නිසා, මේ ප්‍රමාදය නිසා, ආණ්ඩුවේ වැඩ භාර ගන්නට කිසිම කෙනෙකු සතුටු නැහැ. අගමැතිතුමා යටතෙයි මේ අංශය තිබෙන්නෙ. එම නිසා මා අගමැතිතුමාගෙන් එක් ඉල්ලීමක් කරනවා. මීට වඩා ලිහිල් ක්‍රමයකට පුපුරණ ද්‍රව්‍ය ලබා ගැනීමට යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න. එවැනි වැඩ පිළිවෙළක් සකස් කළොත් ගම්බද ප්‍රදේශවල සුළු කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩත්, ගම්කාර්යසභා මගින් ගමේ දියුණුවට කරන වැඩත් දැනට වඩා ඉක්මණින් කරන්නට පුළුවන් වෙනවා. ඒ වාගේම මේ කොන්ත්‍රාත් ලබා ගැනීමට දැනට වඩා පුද්ගලයින් ඉදිරිපත් වේවි. නමුත් දැන් මේ කොන්ත්‍රාත් වැඩ ලබා ගැනීමට ඉදිරිපත් වන අයගේ සංඛ්‍යාව ඉතාම අඩුයි. ගම්බද ප්‍රදේශවල පාරවල් වැඩි දියුණු කරන්නට හෝ වාරිමාර්ග කටයුතු කරන්නට හෝ අපකොපමණ වෑයම් කළත්, මේ අඩුපාඩුකම් තිබෙන නිසා අපේ උත්සාහය සාර්ථක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුලරත්න මයා.]

වෙන්නේ නැහැ. කොන්ත්‍රාත් වැඩවලට කිසිම කෙනෙකු ඉදිරිපත් වන්නේ නැහැ. එම නිසා මීට වඩා ලිහිල් ක්‍රමයකට පුපුරන ද්‍රව්‍ය ලබා ගැනීමට විධිවිධාන යෙදිය යුතුයි.

සාමාන්‍යයෙන් පුපුරන ද්‍රව්‍යවලට අවසර පත්‍ර ලබාගත් අය ඒ ඒ දිස්ත්‍රික්කවල බොහොම ටික දෙනයි ඉන්නෙ. සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් මේ ද්‍රව්‍ය ගෙන්වා සමුපකාර සමිති මාර්ගයෙන් සෑම ගමකටම බෙදා හරින්නට පුළුවනි. එවැනි වැඩ පිළිවෙළක් ඇති කළහොත් දැනට වඩා පහසුවෙන් අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය ලබා ගැනීමට පුළුවන් වෙනවා. ඒ අන්දමට ප්‍රමාදයක් නැතිව අවශ්‍ය වේලාවට පුපුරන ද්‍රව්‍ය ලබා ගන්නට පුළුවන් වුණොත්, ගම්බද ප්‍රදේශවල දියුණුව සඳහා කළ යුතුව තිබෙන වැඩ දැනට වඩා ඉක්මනින් කරන්නට අවස්ථාව ලැබෙන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ)
(திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)
(Mr. Bernard Soysa—Colombo South)

ගරු සභාපතිතුමනි, ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ විදේශ ප්‍රතිපත්තිය ගැන කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙකුම දැන් කථා කර තිබෙනවා. මේ වැය ශීර්ෂ යටතේ මා කවදත් මතක් කරන කරුණු ස්වල්පයක් ගැන ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවීමටයි, මා බලාපොරොත්තු වෙන්නෙ.

යුද්ධ හමුදාව, රාජකීය ලංකා නාවුක හමුදාව හා රාජකීය ලංකා ගුවන් හමුදාව යන ත්‍රිවිධ හමුදවේ සේවා කොන්දේසි පිළිබඳව අවුරුදුපතාම මේ වැය ශීර්ෂ යටතේ මා කරුණු ඉදිරිපත් කරනවා. ඒ අනුව් නැවත වරක් මතක් කළ යුතු කරුණු කීපයක් තිබෙනවා. සාධාරණ හෝ වේවා, අසාධාරණ හෝ වේවා, මේ හමුදා තුනේම භටයන්ගේ දුක්ගැනවිලි රාශියක් තිබෙනවා. අද තිබෙන රෙගුලාසි අනුව, යුද්ධ හමුදවේ නීතිරීති අනුව් භටයකුට දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කර—විශේෂයෙන්ම විනයානුකූල ප්‍රශ්නයක් ගැන හෝ ඉහළ නිලධාරියාගෙන් ලැබෙන හිරිහැරයක් ගැන හෝ දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කර—සහනයක් ලබා ගැනීමට කිසිදු මාර්ගයක් නැහැ.

හමුදා භටයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට ඔවුන්ට වෘත්තීය සමිතියක් පිහිටුවා ගන්නට ඉඩ දෙන්නය කියා ඉල්ලීමක් කළොත් එම ඉල්ලීම කවදාවත් නොලැබෙන බව මා දන්නවා. එම නිසා මා එවැනි ඉල්ලීමක් කරන්නේ නැහැ. නමුත් යම් දුක්ගැනවිල්ලක් තිබෙනවා නම්, ඒ සම්බන්ධව සහනයක් ලැබිය යුතු නම්, ඒ සහනය ලබා ගැනීමට සාමාන්‍ය භටයකුට යම්කිසි පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. ආරක්ෂා සහිත යම්කිසි මාර්ගයක් තිබෙන්නට ඕනෑ. යුද්ධ හමුදාවේ භටයකු හෝ වේවා, නාවුක හමුදාවේ භටයකු හෝ වේවා, යම් භටයෙකුට දුක්ගැනවිල්ලක් තිබෙනවා නම්—විශේෂයෙන්ම ඉහළින් ලැබෙන නියෝගයක් පිළිබඳව යම් දුක්ගැනවිල්ලක් තිබෙනවා නම්—එය ඉදිරිපත් කරනවා නම් එසේ ඉදිරිපත් කරන්නෙ ඔහුගේ ජීවිතය අතින් අරගෙනයි.

මා එසේ කියන්නේ මේ නිසයි. දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කළ පමණින් අද දඬුවමක් ලැබෙන්නට ඉඩ තිබෙනවා. මා මේ නිලධාරීන්ට දොස් කියනවා නොවෙයි. නමුත් යුද්ධ හමුදාවේ සම්ප්‍රදාය අනුව, නීතිරීති අනුව, විනය අනුව්, අද එවැනි තත්ත්වයක් තිබෙන්නෙ. මීට කලිනුත් මා මෙම ඉල්ලීම ඉදිරිපත් කර තිබෙනවා. දොම්පෙ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම් නිලය දැරූ කාලයේදී මා එතුමාත් සමග මේ කරුණු පිළිබඳව යම් යම් විධිවිධාන යොදන්නට සාකච්ඡාවක් කළා. නමුත් සාකච්ඡාවෙන් එහාට යමක් කරන්නට ඉඩ ලැබුණේ නැහැ. ඒ සාකච්ඡාව් සම්බන්ධ වාර්තාවක් අමාත්‍යාංශයේ තිබෙනවාද නැද්ද කියා මා දන්නේ නැහැ. නමුත් ත්‍රිවිධ හමුදාවේ භටයන්ගේ යම් යම් දුක්ගැනවිලි තිබෙනවා නම්, ඒවා සම්බන්ධව සහනයක් ලැබිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතුව තිබෙනවා නම්, ඒ සහනය ලබා ගන්නට මාර්ගයක් සලසන්නට ඕනෑ. තව දුරටත් මේ දුක්ගැනවිලි පැසි පැසී තිබෙන්නට ඉඩ නොහැර ඒවා ඉදිරිපත් කර සහනයක් ලබාගත හැකි වන සේ යම් මාර්ගයක්, ආරක්ෂා සහිත මාර්ගයක්, සලසා දෙන්නට ඕනෑ.

පඩි ලේඛන ගැන මා පළමුවෙන් මතක් කරනවා. අද තිබෙන වැටුප් පිළිවෙළ තරමක් දුරට ශ්‍රෙෂන් කොමිසමේ වාර්තාව අනුව පිළියෙළ කර තිබෙන බව අප දන්නවා. සමහරුන්ට ශ්‍රෙෂන් කොමිසමේ වාර්තාවෙන් නියම වූ පඩි ලේඛන අනුව පඩි ලැබෙනවා.

ඒ කොමිෂන් සභාවේ සෑම තීරණයක්ම පිළිගත යුතුය කියා මා කියන්නේ නැහැ. එහි ඇතැම් තීරණයන් නියම විධියට සාක්ෂි නොවිමසා ගත් තීරණ හැටියට පිළිගන්නට පුළුවන්. ඒ කොමිෂන් සභාව සාක්ෂි විමසන අවස්ථාවේදී සාමාන්‍ය භටයන්ට ඒ ඉදිරිපිටට ගොස් තමන්ගේ පඩි ප්‍රමාණයන් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නට—ඉල්ලීම් ඉදිරිපත් කරන්නට—අයිතියක් තිබුණේත් නැහැ; ඊට ඉඩ ප්‍රස්ථාවක් සලසා දුන්නෙත් නැහැ. ඒ අය වෙනුවෙන් කථා කරන්නට ගියේ ඉහළ ශ්‍රේණිවලට අයත් නිලධාරීන්. ඒ නිසා සාමාන්‍ය භටයන්ගේ දුක්ගැනවිලි සම්බන්ධව නිසි විධියට තීරණයක් නොලැබුණු බව කියන්නට ඕනෑ. තවමත් යුද හමුදාවේ සාමාන්‍ය භටයන්ගේ පඩිවැඩි කිරීමේ පිළිවෙළ රජයේ සේවයට හෝ වෙළඳ සේවයට අයත් නුපුහුණු කම්කරුවන්ගේ ප්‍රමාණයටවත් සරි ලන්නේ නැති බව කණගාටුවෙන් මතක් කරන්නට ඕනෑ. හමුදා තුනේම පඩි වැඩි වීමේ පිළිවෙළ සකස් කර තිබෙන්නේ සාමාන්‍යයෙන් කෙරෙන පිළිවෙළට වාර්ෂිකව පඩි වැඩි වීමේ පිළිවෙළ අනුව නොවෙයි, වෙනත් ක්‍රමයකටයි. රජයේ සේවකයන්ටවත්, වෙළඳ සේවකයන්ටවත් ගෙවන සාමාන්‍ය පිළිවෙල අනුව නොවෙයි, ඔවුන්ට ගෙවන්නේ. මේ සම්බන්ධව නිසි විධියට වාර්තාවක් සකස් කර, අවුරුදු ගණනාවක් තිස්සේ මේ අයට විඳින්නට සිදු වූ දුක් කම්කටොළුවලට සහනයක් දීම විශේෂයෙන්ම අවශ්‍ය බව මතක් කරන්නට ඕනෑ.

හමුදා භටයන්ගේ වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල පිළිබඳව මා අවුරුදු පතා මතක් කරනවා. මීට පෙර ආණ්ඩුවත් මේ සම්බන්ධව ගණකාධිකාරී වාර්තාවක්—ඇක්චුවේරියල් රිපෝට් එකක්—ලබා ගත්තා. සාමාන්‍ය භටයකුගේ සේවා කාලය පිළිබඳව බලාපොරොත්තු විය හැකි ආයුෂ ප්‍රමාණය කොපමණද, ඔහු විශ්‍රාම ගත් පසු බලාපොරොත්තු විය හැකි ආයුෂ ප්‍රමාණය කොපමණද, ඔහුගේ වැන්දඹු ස්ත්‍රියක් සිටියොත් ඇගේත්, ඔහුගේ දරුවන්ගේත් ආයුෂ ප්‍රමාණයන් කොපමණද යන විස්තර ගණන් බලා ඒ අනුව පඩියෙන් කපා ගත හැකි ප්‍රමාණය කොපමණද, ගෙවිය හැකි ප්‍රමාණය කොපමණද කියා ඒ වාර්තාව අනුව ගණන් බලන්නට ඕනෑලු. ඒ අනුව ගණන් බලා තමයි, රජයේ සේවකයන්ගේ වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල සකස් කර තිබෙන්නේ. මේ සම්බන්ධව ගණකාධිකාරී වාර්තාවක් ලබා ගන්නට මීට පෙර ආණ්ඩුව පියවර ගත්තා. ඒ වාතීාව ලබා ගත්තාය කියා මා විශ්වාස කරනවා. එසේ ලබා ගත්තා නම් මේ සභාවට විශේෂ පනතක් ඉදිරිපත් කර ඒ අරමුදල ඇති කිරීම ඉතාමත් අවශ්‍ය දෙයක්.

ගරු සභාපතිතුමනි, අනවශ්‍ය උදවියට වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල් ගෙවීමට මේ ආණ්ඩුවත් කටයුතු කරනවා; මීට පෙර ආණ්ඩුවත් කටයුතු කළා. රජයේ සේවකයන් සඳහා වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලක් තියෙනවා. රජයේ සේවයට බැඳුණු කෙනෙක් සේවයේ ස්ථිර වූ වහාම, එම අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසු තත්ත්වයක සිටියත් නැතත්, එම අරමුදලේ සාමාජිකත්වය ලබා ගන්නට ඕනෑ. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පිරිවෙන් පරීක්ෂක නිලය සඳහා ගරු ස්වාමීන් වහන්සේ නමක් පත් වූ විටත්, රජයේ සේවකයන්ගේ වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවන්නටය කියා ඒ ස්වාමීන් වහන්සේටත් නියම කරනවා. ඒ ස්වාමීන් වහන්සේගේ වැටුපෙනුත් කොටසක් ඒ අරමුදලට කපා ගන්නවා. මේ අන්දමට අනවශ්‍ය අයට මේ පහසුකම සලසා දෙන අතර යුද හමුදාවේ සිටින සියළු දෙනාටම මේ පහසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

කම සලස්වා නැහැ. ඒ නිසා වැඩි ප්‍රමාදයක් නැතිව ඒ අයට මේ පහසුකම සලස්වා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 2.45

නඩුවකට අසු වී සිටින, සැකයට භාජන වී සිටින ඇතැම් නිලධාරීන්ගේ පඩිනඩි ආදිය සම්බන්ධව අද කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) කථා කළා. ඒ නිසා මා මේ අවස්ථාවේදී ඒ ගැන වැඩිපුර යමක් කියන්නට යන්නේ නැහැ. විශේෂයෙන් එක් කාරණයක් ගැන පමණක් මතක් කරන්නට ඕනෑ. රාජ්‍ය විරෝධි කුමන්ත්‍රණයක් පිළිබඳවය කියා පරීක්ෂණයක් පැවැත්වූ අවස්ථාවේදී තිලකවර්ධන නමින් සිටි, කෝප්‍රල් තනතුර දැරූ කෙනෙකු පොලීසියේ අත්අඩංගුවේ සිටි බව තමුන්නාන්සේ දන්නවා. අත්අඩංගුවට ගනු ලැබ පොලීසිය භාරයේ සිටිද්දී ඔහු මැරුණා. ඒ ගැන මා යමක් කියන්නට අදහස් කරන්නේ නැහැ. ඔහු සැකයට භාජන වූ කෙනකු හැටියට සිටි නමුත් ඔහුට විරුද්ධව කිසිම දෙයක් ඔප්පුවෙලා තිබුණේත් නැහැ. සාමාන්‍ය නීති රීති යටතේ ඔහුට කිසිම නඩුවකට මුහුණ දෙන්නට සිදු වූයේත් නැහැ. යුද හමුදාවට අයත් නීති රෙගුලාසි යටතේ සාමාන්‍යයෙන් "කෝට් මාර්ෂල්" නමින් හඳුන්වනු ලබන ක්‍රියා මාර්ගය යටතේ නඩු තිබුණත් ඉන් වැරදිකරුවකු හැටියට ඔප්පු වී තිබුණේත් නැහැ. ඒ කොයි හැටි වෙතත් ඔහුගේ ඇවෑමෙන් පසු ඔහුගේ නමින් ජීවත් වන—ඔහුගෙන් එතෙක් යැපුණු—වැන්දඹු ස්ත්‍රියට සහ දරුවන්ට කිසිම දෙයක් ලැබුණේ නැහැ. මා දැන් සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වන්නේ මුලින් සඳහන් කළ තිලකවර්ධන මහත්මයා වැරදි කළ කෙනෙක්ද නැද්ද යන ප්‍රශ්නය නොවෙයි. ඔහුට විරුද්ධව කිසිම චෝදනාවක් ඔප්පුවෙලා තිබුණේ නැහැ. කෙනකුට විරුද්ධව යම් චෝදනාවක් ඉදිරිපත් කර තිබුණත් එය ඔප්පු වනතුරු වරදකරුවකු ලෙස සලකන සිරිතක් නැහැ. චෝදනාව ඔප්පු වනතුරු පොලිස් අත්අඩංගුවේ සැකකරුවෙකු හැටියට සිටි පමණටම ඔහුට හෝ ඔහුගෙන් යැපෙන අයට—යම් අනාගත බලාපොරොත්තුවක් ඇතිව සිටි අයට—දඬුවම් කිරීම සුදුස්සක් නොවන බවයි මා මෙහිදී මතක් කරන්නේ. ඒ නිසා ඒ අය වෙනුවෙන් යම් දීමනාවක් ලැබෙන්නට සැලැස්සීම විශේෂ යුතුකමක් හැටියට මා සලකනවා.

වැඩි වේලාවක් නොගන්නා බවට ප්‍රතිඥාවක් දෙමිනුයි මා නැඟිට්ටේ. ඒ නිසා මේ ශීර්ෂය යටතේ කරන කථාවට මා වැඩි වේලාවක් ගන්නේ නැහැ. පොලීසිය ගැනයි ඊළඟට කියන්නට අදහස් කරන්නේ. මේ වැය ශීර්ෂය ගැන කථා කරන අවස්ථාවලදී ගරු මන්ත්‍රීන් බොහෝ දෙනා නැගිට තම තමන්ගේ පළාත්වල පොලීසිය විසින් මහජනයාට කර තිබෙන යම් යම් අඩන්තේට්ටම් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන බව මා දන්නවා. පොලීසිය මහජනයාට කර තිබෙන හිරිහැර වෙතොත් ඒවාත්, පොලිස් පරීක්ෂකවරයෙකු නැත්නම් උප පරීක්ෂකවරයකු හෝ වෙනත් නිලයක් දරන කෙනකු හෝ අසාධාරණ විධියකට නැතිනම් දේශපාලන පක්ෂපාතිත්වයක් ඇතිව ක්‍රියා කර තිබෙන අවස්ථාවල් ගැනත් සමහර විට පැමිණිලි කරනවා. ඒවා නොසිදුවෙතැයි මා කියන්නේ නැහැ. එහෙත් මා සාමාන්‍යයෙන් මේ ගරු සභාවේදී ඒ විධියේ චෝදනා ඉදිරිපත් කරන්නට අකමැතියි. මා බලාපොරොත්තු වන්නේ පොලීසියේ වෙනත් මුහුණුවරක් ගැන කථා කරන්නටයි.

මා දැන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ පොලීසියේ සිටින සාමාන්‍ය භටයන්ගේ දුක් ගැනවිලි ගැනයි. ඒ ගැනත් සලකන්නට ඕනෑ. පොලීසිය යම් වරදක් කරතොත් ඒ ගැන සොයා බලා ක්‍රියා කරන අතර, ඒ හමුදාවට හෙවත් ඒ සේවයට බැඳී සිටින අයගේ දුක් ගැනවිලි ගැනත් සොයා බැලීම, සලකා බැලීම ඉතා වැදගත් දෙයක් ලෙසත්, අප වෙත පැවරී තිබෙන යුතුකමක් හැටියටත් අප කල්පනා කරන්නට ඕනෑ. ඒ උදවියගේ දුක්ගැනවිලි ගැන සලකා බැලීමත් අපට පැවරී තිබෙන යුතුකමක් හැටියට සැලකීම අවශ්‍ය බව මතක් කර දෙන්නට කැමතියි. පොලිස් භටයන්ගේ දුක්ගැනවිලි අතර ප්‍රධාන අංකයෙහිලා සලකන්නට තිබෙන්නේ ඒ අයගේ සේවා කාලය—දෛනික සේවා කාලය—පිළිබඳව සාධාරණ නියමයක් තවමත් නොමැතිවීමයි. පොලිස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

භටයන් වැටෙන වර්ගයටම අයත් තවත් සේවක කණ්ඩායම් ගණනාවක්—රෝහල් වල වැඩ කරන ඇතැම් සේවකයන් ද ඇතුළුව—රජයේ සේවයේ සිටින බව මා දන්නවා. එක හා සමාන වන දුක්ගැනවිලි තිබෙන රජයේ සේවකයන් විශාල සංඛ්‍යා වක් සිටිනවා. සේවය කළ යුතු කාලය දවසකට පැය අටක් හෝ නවයක් විය යුතු යයි පිළිගැනෙනොත් මේ උදවියටත් එහි ප්‍රයෝජනය විඳීමට—ඒ ප්‍රයෝජනය ලබා ගැනීමට—පැය අටේ නීතිය, විවේක පැයත් එකතු කළාම පැය නවයේ නීතිය, සාමාන්‍යයෙන් වලංගු විය යුතු ආකාරයට වැඩ පිළිවෙළක් සකස් කළ යුතුය කියන අදහසයි ඒ උදවිය ඉදිරිපත් කරන්නේ. දැනට පොලිසියේ සිටින සේවකයන්ට අතිකාල දීමනා ගෙවන්නට පිළිවෙළක් නැහැ. ඒ නිසා සාධාරණ අන්දමින් පැය අටේ දිනය ක්‍රියාත්මක කරන්නට පුළු වන් වන ආකාරයට වැඩ පිළිවෙළක් සකස් කරනවාත් එක්කම වැඩිපුර කාලයක් වැඩ කරන පොලිස් භටයන්ට අතිකාල දීමනා ගෙවන්නට ක්‍රමයක් සකස් කළ යුතුයි.

ඊළඟට මීට පෙර කටුගම්පල ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) විසින් මෙම ගරු සභාවේදී මතක් කරන ලද කාරණ යක් ගැන සඳහන් කරන්නට කැමතියි. පොලිස් භටයන්ගේ වාර්ෂික වැටුප් වැඩි කිරීමට පෙර ඔවුන් අපරාධකරුවන් කී දෙනකු අල්ලා ගත්තා දැයි පරීක්ෂා කර බලනවා. අපරාධකරුවන් අල්ලා ගෙන තිබෙන ප්‍රමාණය අනුව සලකා බලමිනුයි, වාර්ෂික වැටුප් වැඩි වීම නිර්දේශ කරන් නේ. මේ සඳහා විශේෂයෙන් මුද්‍රණය කරන ලද කොළයක් තිබෙනවා. දැන් ඒ කොළයක් මා අතේත් තිබෙනවා. එහෙත් ඒ කොළය මට දුන් තැනැත්තාගේ රැකි යාව පිළිබඳව ඇති භය නිසා මා ඒ කොළය ඉදිරිපත් කරන්නේ නැහැ. කෙසේ වෙ තත් එවැනි කොළයක් තිබෙනවා. අසුවල් භටයාගේ වාර්තාව යයි එහි සඳහන් වෙ නවා. තමන් අපරාධකරුවන් කී දෙනකු අල්ලා ගත්තා ද, නඩු කීයක් පැමිණිලි කළා ද, නඩු කීයක් ඔප්පු වුණා ද යන කරුණු සියල්ලම ඒ කොළයෙහි ලියන් නට ඕනෑ. ඒ කොළය බලමිනුයි, වාර්ෂික වැටුප් වැඩි වීම් නිර්දේශ කරන්නේ. අපරාධකරුවන් තිදෙනකුට අඩුවෙන් අල්ලාගෙන තිබුණොත් වාර්ෂික වැටුප් වැඩි වීම් නැහැ. මෙයින් අහිංසක උදවිය පවා අත් අඩංගුවට ගැනීමට පොලිස් භටයන්ට බල කිරීමක් වෙනවා. සේ වයෙහි සිටින හැම දෙනාම වාර්ෂික වැටුප් වැඩිවීම් ලබා ගන්නට කැමතියි. නුපුහුණු කම්කරුවාගේ පටන් සියලු දෙනාම ඊට කැමතියි. නුපුහුණු කම්කරුවා පවා එක් අවුරුද්දක් ගෙවී ඊළඟ අවුරුද්ද ලබන විට යටියන්තොට ගරු මන්ත්‍රී තුමාගේ (ආචාර්ය එන්. එම්. පෙරේරා) නියමයෙන් ලැබෙන රුපියල් 2.50 වැටුප් වැඩි වීම ලබා ගන්නට—ඊට කලින් ලැබු ණේ රුපියලයි—ආශාවෙන් සිටිනවා. ගෙදර දොර වුවමනා වැඩි වන ප්‍රමාණයේ හැටියට වියදම් කිරීමට මුදල් වැඩියෙන් ලැබෙතැයි බලාපොරොත්තු වෙනවා. එහෙත් පොලිස් භටයන්ට නම් ඒ විධියට බලාපොරොත්තු වන්නට බැහැ. වාර්තා පත්‍රිකා අනුව අපරාධකරුවන් තිදෙනකු වත් අල්ලා නොගත්තොත් වාර්ෂික වැටුප් වැඩි වීම ලැබෙන්නේ නැහැ. මෙය අසාධාරණයි. පොලිස් භටයන් සම්බන්ධ යෙන් සලකන විට මෙය අසාධාරණ වන්නා සේම මහජනයා සම්බන්ධයෙන් සලකන විට මෙය හිරිහැර දායකයි. අහිං සකයන් පවා අල්ලා ගන්නට මෙයින් පෙළඹවීමක් තිබෙනවා. ඒ නිසා මේ ක්‍රමය නොසුදුසුයි. කටුගම්පළ ගරු මන්ත්‍රීතුමා ඔය අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම් වරයා වශයෙන් සිටියදී මෙම කාරණය සම්බන්ධයෙන් මෙම ගරු සභාවේදී කථා කරන්නට යෙදුණා. මෙය වෙනස් කරන් නට බලන බව එතුමා කීවා. ඇත්තෙන්ම කලක් මෙය ක්‍රියාත්මක නොකර තිබුණා. ටික කලකට පසුව නැවතත් ක්‍රියාත්මක වුණා. මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ වාර්ෂික වැටුප් වැඩි වීමත්, අපරාධකරුවන් අල්ලා ගැනීම පිළිබඳ වාර්තාවත් එකට සම්බන්ධ නොකරන ලෙසටයි. මේ දෙක අතර ඇති සම්බන්ධ තාව නැති කරන්න. අපරාධකරුවන් අල්ලා ගැනීමේ ප්‍රමාණය අනුව වැටුප් වැඩිවීම් නිර්දේශ කිරීම නුසුදුසුයි.

මීට පෙර මතක් කර තිබෙන තවත් කාරණයක් ගැන සඳහන් කරන්නට කැමතියි. පොලිස් භටයන්ට තිබෙන අයිති වාසිකම් පොලිස් සේවයේ සිටින පියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

දුරන්ට ලැබෙන්නේ නැහැ. ඒ අතර රජයේ සේවයේ සිටින අනෙක් රියැදුරන්ට ලැබෙන අයිතිවාසිකම් ලැබෙන්නේත් නැහැ. මේක අමුතු තත්ත්වයක්. ඔවුන් කරන්නේ පොලිස් රිය ධාවනය කිරීමයි. එහෙත් සාමාන්‍ය රජයේ රියැදුරන්ට තිබෙන අයිතිවාසිකම් ඔවුන්ට ලැබෙන්නේ නැහැ. පොලිස් භටයන්ට තිබෙන අයිතිවාසිකම් ලැබෙන්නේත් නැහැ. අනෙකුත් රියැදුරන්ට මෙන් වැඩ කරන කාල සීමාව අනුව ඔවුන්ට අතිකාල දීමනා ලැබෙන්නේ නැහැ. අනික් පැත්තෙන් පොලිස් භටයන් හැටියට ලැබිය යුතු අයිතිවාසිකම්වත් ලැබෙන්නේ නැහැ. ඒ උදවිය කරන්නේ රියැදුරුකමයි. ඒ උදවිය පොලිස් විනය යටතේ සිටිතත් රියැදුරන් හැටියට සලකා ගෙන පඩිනඩි යනාදිය නොදෙන්නේ කුමන කරුණක් නිසාදැයි මා ප්‍රශ්න කරනවා.

මා මීට වඩා කාලය ගත කරන්නට අදහස් කරන්නේ නැහැ. මේ අවුරුද්ද තුළ මෙම කරුණු සියල්ලක්ම ඉටු කරන්නට නොහැකි වුවත් හැකි පමණින් යම්කිසි සහනයක් සලසා දෙන හැටියට ගරු අගමැතිතුමාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனே)
(Mr. T. B. M. Herath—Walapane)

ගරු අගමැතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස විශේෂ කරුණක් දෙකක් ඉදිරිපත් කරන්නට මා කල්පනා කරනවා. මෙම කරුණු අළුත් ඒවා නොවෙයි; කීප වතාවකම මෙම ගරු සභාවට ඉදිරිපත් කළ ඒවායි. එහෙත් ඒවා පිළිබඳව නැවත වරක් ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවීම සඳහායි, මෙසේ ඉදිරිපත් කරන්නේ. පොලීසියේ රාජකාරියට යටත් නොවන ප්‍රදේශ ලංකාවේ බොහෝ පළාත් වල—විශේෂයෙන් උඩරට වතුකරයේ— තිබෙනවා. වතුකරයේ සිටින පුරවැසියන් නොවන උදවිය ආරක්ෂා කිරීමෙහි යෙදී සිටින මේ පොලීසිය එම වතුකරයේම වතුවලට මැදිවී තිබෙන ගම්මානවල ජීවත්වන සාමාන්‍ය ජනතාව ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කරන්නේ නැහැ. පොලිස් වැයික්කියක් නොවේය යන අදහස උඩ විශේෂයෙන් වලපනේ, හඟුරන්කෙත වැනි ප්‍රදේශවල ජීවත්වන ගම්බද ජනතාවට පොලිස් ආරක්ෂාව සැලසෙන්නේ නැහැ. මෙම ප්‍රශ්නය පිළිබඳව නොයෙකුත් අවස්ථාවන්හිදී අප කතා කර තිබෙනවා. 1965 න් පසු මෙම පාර්ලිමේන්තු කාලය තුළ එක් වරක් ගරු අගමැතිතුමා වෙනුවට රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙමින් කීවා, නිල්දණ්ඩාහින්නේ අලුත් පොලීසියක් ආරම්භ කිරීම සඳහා කටයුතු කරගෙන යන බව. ඒ පිළිබඳව දැන් ලැබෙන ආරංචි මොනවාද? දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ප්‍රකාශ කළාක් මෙන් ටිකක් මවිතයට හේතුවන පිළිතුරක් තමා දැන් පොලිස් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන්නේ. ඒ ප්‍රදේශයේ අපරාධ සංඛ්‍යාව අඩු නිසා පොලීසියක් වුවමනා නැති බවයි කියන්නේ. සම්පූර්ණ ආදායම් පාලක කොට්ඨාශයකම ගම්බද ජනතාව මේ විදියට අමතක කර දමා තිබෙනවා. පොලිස් ආරක්ෂාව ඔවුන්ට නොදී සිටිනවා.

ග්‍රාම සේවකයන්ගෙන් කෙරෙන රාජකාරි කටයුතු දෙස බලන විට පොලිස් සේවාව එම ප්‍රදේශවලට අවශ්‍ය බව කියන්නට ඕනැ. යම් පිරිසකට ලබා දියයුතු ආරක්ෂාව ඔවුන්ට ලබා නොදෙන්නේ ඔවුන් අපරාධ නොකරන නිසාය කියනවා නම් ඇත්ත වශයෙන්ම අපට ඒ කියමන අනුමත කරන්නට බැහැ. ආරක්ෂාව වැඩි වැඩියෙන් සලසා දිය යුත්තේ, අපරාධ නොකරන උදවියට තමයි. හොඳින් ජීවත්වන මිනිසුන්ට නොසලකා හැරීමේ පුරුද්දක් තිබෙනවා නම් එය වරදක් හැටියට හඳුන්වා දෙන්නට පුළුවනි. අප ඇතැම්විට පොලීසිය විවේචනය කරනවා. පොලීසියේ නොයෙකුත් වැරදි ක්‍රියා පිළිබඳව කතා කරනවා. ඊයේ පෙරේදා ගරු අගමැතිතුමාගේ විශේෂ අවධානය යොමු කළා, මගේ කොට්ඨාශයේ සිදු වුණු එක්තරා සිද්ධියක් පිළිබඳව. මා සිතන්නේ එම අවස්ථාවේදී ඒ වෙනුවෙන් මට පිළිතුරක් ලැබුණේ නැතෙ කියායි. එතුමා ඒ සම්බන්ධයෙන් ලැබුණු වාර්තාව ගැනත් සතුටට පත් වුණේ නැති බව කියන්නට යෙදුණා. එම නිසා මෙම කාරක සභා අවස්ථාවේදී හෝ ඊට පසුව හෝ උඩපුස්සැල්ලාව පොලීසියේ සිද්ධිය පිළිබඳව යම්කිසි ප්‍රකාශයක් කරනවා ඇතැයි මා විශ්වාස කරනවා. එවැනි සිද්ධීන් පිළිබඳව එතුමාගේ අවධානය යොමු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීම ඉතාම අවශ්‍යයි. අපේ මහජනතාව කියන්නේ පොලීසියේ යම් යම් වැරදි තිබුණත් එහි ආරක්ෂාව තමන්ට අවශ්‍ය බවයි. එක්කෙනෙක් දෙන්නෙක් නැතිනම් හත් අට දෙනෙක් වැරදි කළ පලියට මුළු පොලීසියම අපට එපාය කියන්නට අප කොහෙත්ම සූදානම් නැහැ. මා සිතනවා, තමුන්නාන්සේ වලපනේ කොට්ඨාශයට ගොස් තිබෙන නිසා මේ කරුණු හොඳින් දන්නවා ඇත කියා.

අ. භා. 3.00

වලපනේ ඡන්දදායක කොට්ඨාශයේ සමහර වතුවලටත් පොලිස් සේවය ලැබෙනවා. මේ පැත්තේ සිට හැතැප්ම 10-15 ගම් මැදින් ගිහින් එහා පැත්තේ තිබෙන සමහර වතුවලටත් පොලිස් සේවය ලැබෙනවා. ඒවායේ පොලිස් වැසික්කි තිබෙනවා. ඒ අතරතුර පිහිටි ගම් මැදිවලට සේවය ලැබෙන්නේ නැහැ. අළුත් ගොඩනැගිලි සාදා පොලිස් මධ්‍යස්ථාන ඇති කරන්නට අමාරු නම් දැනට වලපනේ, මතුරට, රාගල, උඩපුස්සැල්ලාව ආදි පොලිස් මධ්‍යස්ථාන වල සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව වැඩි කර, මා කලින් සඳහන් කළ ගම් මැදි වල සේවය සඳහා බෙදා හරින්නට සලකා බලනවා නම් මා කෘතඥ වෙනවා, එය අත්‍යවශ්‍ය කරුණක් හැටියට පෙනෙන නිසා.

